unit
04

# ආණ්ඩුවේ ස්වභාවය

වාගීෂ්වර

## 4.1 ආණ්ඩුව

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
  - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු කුමක් ද?
  - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කළ යුතු හා නොකළ යුතු කරුණු
  - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක කාර්යභාරය
  - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වර්ගීකරණය
  - ව්‍යවස්ථානුකූල වාදය

sureka wageeshwara

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු කුමක් ද?

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු කුමක් ද?

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් පොදු විශ්වීය අර්ථ කථනයක් සැපයිය නොහැක. දේශපාලන විද්‍යාඥයින් විවිධ රාජ්‍යයන් තුළ දී ඒ ඒ රාජ්‍යයන්ට හා පාරිසරික තත්ත්වයන්ට ගැළපෙන පරිදි විවිධ ආකාරයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කොට තිබේ.

- <u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් පළ වී ඇති පොදු නිර්වචන.</u>

> "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු රටක් පාලනය කරන මූලික නීතියයි."
>
> "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු රටේ ක්‍රියාත්මක වන මූලික ආයතන පිළිබඳ විස්තර කරන වැඩ පිළිවෙලක් වේ. එනම්, ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ ත්‍රිවිධ ආයතන සතු බලතල, සංයුතිය, එම ආයතන අතර ඇති අන්තර් සම්බන්ධතාවය, එම ආයතන හා මහජනතාව අතර ඇති සම්බන්ධය විස්තර කරන වැඩ පිළිවෙලක් ලෙස අර්ථ දැක්විය හැකිය."

- <u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් පළ වී ඇති දාර්ශනික නිර්වචන.</u>

"ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණය නිර්මාණය කිරීම, සංවිධානය කිරීම හා නිර්වචනය කිරීමත්, ඒවාට බලතල වෙන් කිරීම සඳහා පවතින නීති මාලාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වේ."

-ඩී. ටොකුවිල්-
(බ්‍රිටැනිකා විශ්වකෝෂය)

"රාජ්‍යයේ උත්තරීතර බලය ක්‍රියාවට නංවන ආණ්ඩුවේ ආයතනික ව්‍යූහය තීරණය කරන ලියවිල්ල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වේ."

-ජොන් ඔස්ටින්-

"රාජ්‍යයක පරමාධිපත්‍ය බලය බෙදා හැර ඇති ආකාරය දක්වන සියලුම ආකාරයේ ඍජු හා වක්‍ර නීති අඩංගු ලියවිල්ල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වේ."

-ඩයිසි-

"දේශපාලන සමාජයක සැකැස්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි."

-බ්‍රයිස් සාමිවරයා-

"රාජ්‍යය තුළ වාසය කරන පුරවැසියන් තුළ පැවතිය යුතු සම්බන්ධතාවයේ ස්වරූපය විධිමත්ව දක්වන ලේඛණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වේ."

-ඇරිස්ටෝටල්-

ඉහත ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු කුමක් දැයි හඳුනාගැනීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යස්ථාව සම්බන්ධයෙන් දේශපාලන විද්‍යා ලිඛිත සාහිත්‍යමය මූලාශ්‍ර තුළ සටහන් වන පොදු හා දාර්ශනික නිර්වචන භාවිත කළ හැකිය.

● <u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සතු ලක්ෂණ.</u>

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බොහෝ විට ලිඛිත එකක් වීම.
(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බොහෝ විට අනම්‍ය එකක් වීම.
(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උත්තරීතර දෙයක් වීම.

<u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බොහෝ විට ලිඛිත ස්වරූපයක් ගැනීම හඳුනගත හැකි ලක්ෂණයකි.</u> වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් බොහෝ ජාතික රාජ්‍යයන්හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලේඛණගත කර තිබේ. ඉහත සඳහන් කළ නිර්වචන මගින් ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලේඛනයක් බව හඳුනාගත හැකිය. <u>ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට නිදර්ශන.</u>

නිදර්ශන -: ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

<u>නමුත් අලිඛිත මට්ටමින් ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් ද පවතී.</u> මීට අදාළ ශක්තිමත් නිදර්ශනයක් වන්නේ **බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි.** බ්‍රිතාන්‍යය තුළ අලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ක්‍රියාත්මක වුවද ඇතැම් කරුණු (ව්‍යවස්ථා) ලේඛන ගත කර තිබේ. ඒ අනුව බොහෝ විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලිඛිත වීමේ සම්භාවිතාවක් පවතී.

<u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බොහෝ විට අනම්‍ය ස්වරූපයක් ගැනීම ලක්ෂණයකි.</u> නූතන ජාතික රාජ්‍යයන්හි පවතින බොහෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් අනම්‍ය වේ. **අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනුවෙන් අර්ථවත් වන්නේ ව්‍යවස්ථාදායකයේ සරල බහුතරයකින් (½ කින් ) සංශෝධනය කළ නොහැකි, ව්‍යස්ථාව සංශෝධනය සඳහා විශේෂ ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු ව්‍යවස්ථාවන් ය.** <u>අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට නිදර්ශන.</u>

නිදර්ශන -: **ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.**

[මෙම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා ව්‍යවස්ථාදායකය වන කොංග්‍රස් මණ්ඩලයේ විශේෂ බහුතරයක (2/3 ක) අනුමැතිය හා ප්‍රාන්ත (3/4 ක) අනුමැතිය අවශ්‍යය.]

**ශ්‍රී ලංකා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.**

[මෙම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රම දෙකක් භාවිත කරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **1 - 2 - 3 - 6 - 7 - 8 - 9 -10 - 11 - 30(2) - 62(2)** වගන්ති සංශෝධනය සඳහා පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයක (2/3 ක) අනුමැතිය ද ජනමත විචාරණයක දී ජනතාවගේ අනුමැතිය ද අවශ්‍ය වේ. **1 - 2 - 3 - 6 - 7 - 8 - 9 -10 - 11 - 30(2) - 62(2)** වගන්ති හැර සෙසු වගන්ති පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් (2/3 කින්) සංශෝධනය කළ හැකිය.]

නමුත් අනම්‍ය පදනමකින් ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ද පවතී. නිදසුන් ලෙස **බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව** දැක්විය හැකිය. **බ්‍රිතාන්‍ය ව්‍යවස්ථාව ආණ්ඩුක්‍රම නීතිය ට අනුව නම්‍ය මුත් ප්‍රායෝගික භාවිතය තුළ දැඩි අනම්‍ය ස්වභාවයක් දරයි.** මින් පැහැදිලි වන්නේ බොහෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් අනම්‍ය වීමේ සම්භාවිතාවක් පවතින බවයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උත්තරීතර දෙයක් වීම ලක්ෂණයකි. ව්‍යවස්ථාව උත්තරීතරවීම සඳහා බලපෑ හේතු, රාජ්‍යයක සියලු කාර්යයන් ව්‍යවස්ථාවට අනුකූලව සිදු කිරීම - ආණ්ඩුවේ ත්‍රිවිධ ආයතන වලට බලතල ව්‍යවස්ථාවෙන් පවරා දීම - පුරවැසියාගේ මූලික අයිතීන් ආරක්ෂා කිරීම - ව්‍යවස්ථාදායකය සාමාන්‍යය නීති ව්‍යවස්ථාවට අනුකූලව නිර්මාණය කළ යුතු වීම වැනි කරුණු නිසා ව්‍යවස්ථාව උත්තරීතර වේ. මෙම තත්ත්වය නිසා **දේශපාලන සමාජයක් තුළ ව්‍යවස්ථානුකූල භක්තිය ව්‍යවස්ථාව සිවිල් ආගමක් බවට පත් වී ගෞරවාන්විත උත්තරීතර දෙයක් බවට ස්ථාපනය වී තිබීම ලක්ෂණයකි.**

**තවදුරටත් ,**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්දැයි හඳුනාගැනීම සඳහා **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට ඇතුළත් කළ යුතු හා නොකළ යුතු කරුණු - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක කාර්යයභාරය - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ගීකරණය - ව්‍යවස්ථානුකූල** වාදය වැනි කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇත.

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට ඇතුළත් කළ යුතු

# හා

# නොකළ යුතු කරුණු

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට ඇතුළත් කළ යුතු හා නොකළ යුතු කරුණු

පොදු හැඳින්වීම,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට ඇතුළත් විය යුතු හා නොවිය යුතු කරුණු සම්බන්ධයෙන් පොදු එකඟතාවයක් නොමැත. වඩාත් විද්‍යාත්මක ක්‍රමය වන්නේ ඒ ඒ ජාතික රාජ්‍යයන් විසින් ස්වකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් විය යුතු හා නොකළ යුතු කරුණු තීරණය කිරීමයි. නමුත් ආණ්ඩුක්‍රම වේදීන් හා දේශපාලන විද්‍යාඥයින් විසින් යම් මූලික පදනමක සිට ව්‍යවස්ථාවකට ඇතුළත් කළ යුතු හා නොකළ යුතු කරුණු දක්වයි.

### ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කළ යුතු කරුණු.

හැඳින්වීම,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට ඇතුළත් කළ යුතු කරුණු දළ වශයෙන් පහත පරිදි දැක්විය හැකිය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට ඇතුළත් කළ යුතු කරුණු ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.

(i) **ව්‍යවස්ථානුකූල දර්ශනය**
(ii) **දේශපාලන සමාජ ආර්ථික දර්ශනය**

කරුණු

1. ස්වාධිපත්‍ය බලය (පරමාධිපත්‍ය බලය) හිමි කාට ද යන්න.
2. කුමන වර්ගයකට අයත් රාජ්‍යයක් ද යන්න.
3. රාජ්‍යයේ අරමුණ කුමක් ද යන්න.
4. බලතල බෙදා හැර ඇති ආකාරය සම්බන්ධයෙන්.
5. ආණ්ඩුවේ ආයතනික ව්‍යුහය සම්බන්ධයෙන්.
6. අධිකරණයේ ස්වාධීනත්වය සම්බන්ධයෙන්.
7. පුරවැසියාගේ මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන්.
8. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන ආකාරය.
9. රාජ්‍ය ප්‍රතිපත්ති හා මූලධර්ම පිළිබඳව.
10. නියෝජන මූලධර්ම හා සිද්ධාන්ත පිළිබඳව.

● <u>ස්වාධිපත්‍ය බලය (පරමාධිපත්‍ය බලය) හිමි කාට ද යන්න.</u>

**ස්වාධිපත්‍ය බලය (පරමාධිපත්‍ය බලය) හිමි කාට ද යන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්විය යුතු වැදගත් කරුණකි.** නූතනයේ බොහෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් තුළ පරමාධිපත්‍ය බලය ජනතාව සතු යැයි දක්වා ජනතාව විසින් පරමාධිපත්‍ය බලය කිසියම් නිශ්චිත කාල සීමාවකට ජනතා නියෝජිතයින්ට ලබා දෙන බව දක්වා තිබේ.

**නිදර්ශන -:** 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ i පරිච්ඡේදයේ iii වගන්තිය.

"ශ්‍රී ලංකා ජන රජයේ පරමාධිපත්‍ය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේ ය. පරමාධිපත්‍ය අත් හල නොහැක්කේ ය. පරමාධිපත්‍යයට පාලන බලතල, මූලික අයිතාවාසිකම් සහ ඡන්ද බලය ද ඇතුළත් වන්නේ ය."

● <u>කුමන වර්ගයකට අයත් රාජ්‍යයක් ද යන්න.</u>

කුමන වර්ගයකට අයත් රාජ්‍යයක් දැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්විය යුතු ය. නූතනය තුළ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය - සමාජවාදී රාජ්‍යය - සමාජ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය යනුවෙන් දේශපාලන න්‍යාය මත නිර්මාණය කර ගත් විවිධ රාජ්‍යය ආකෘතීන් පවතී. එම නිසා මේ කුමන වර්ගයකට අයත් රාජ්‍යයක් දැයි ව්‍යවස්ථාවේ දැක්විය යුතු ය.

නිදර්ශන -: 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ i පරිච්ඡේදයේ i වගන්තිය.

"ශ්‍රී ලංකාව, ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයකි."

● <u>රාජ්‍යයේ අරමුණ කුමක් ද යන්න.</u>

රාජ්‍යයේ අරමුණ කුමක් ද යන්න ව්‍යවස්ථාවේ දැක්විය යුතු තවත් වැදගත් සිද්ධාන්තයකි. නිදර්ශන ලෙස <u>ඇමරිකානු ආණ්ඩුක්‍රම</u> ව්‍යවස්ථාව තුළ ස්වකීය රාජ්‍යයේ අරමුණ මෙසේ දක්වා තිබේ.

නිදර්ශන -: "ඇමරිකානු එක්සත් ජනපද වාසීන් වන අපි වඩාත් පරිපූර්ණ එක්සත් රාජ්‍යයක් ගොඩ නගා ගැනීම සඳහාත් - සාමය තහවුරු කර ගැනීම සඳහාත් - ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහාත් - පොදු සුබසාධනය දියුණු කර ගැනීම සඳහාත් - අපේ නිදහස ආරක්ෂා කර ගැනීම සඳහාත් - සෞභාග්‍යය උදාකරගැනීම සඳහාත් - ඇමරිකානු එක්සත් ජානපදිකයන් වෙනුවෙන් මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කරමු."

● <u>බලතල බෙදා හැර ඇති ආකාරය සම්බන්ධයෙන්.</u>

බලතල බෙදා හැර ඇති ආකාරය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්විය යුතු ඉතා වැදගත් <u>මූලධර්මයකි</u>. එනම්. සියලුම බලතල මධ්‍ය ආණ්ඩුව වෙත ඒකරාශී කරන ලද <u>ඒකීය රාජ්‍යයක් ද?</u> නැතිනම් මධ්‍ය ආණ්ඩුවට අමතරව ප්‍රාන්ත ආණ්ඩු වලට බලතල බෙදා හරින ලද <u>සන්ධීය රාජ්‍යයක් ද?</u> යන්න දැක්විය යුතුය. සන්ධීය රාජ්‍යයක් නම් මධ්‍ය හා ප්‍රාන්ත ආණ්ඩු වල බලතල වෙන වෙනම දැක්විය යුතු ය.

නිදර්ශන -: 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ i පරිච්ඡේදයේ ii වගන්තිය.

"ශ්‍රී ලංකා ජනරජය ඒකීය රාජ්‍යයකි."

● <u>ආණ්ඩුවේ ආයතනික ව්‍යූහය සම්බන්ධයෙන්.</u>

ආණ්ඩුවේ ආයතනික ව්‍යූහය සම්බන්ධයෙන් විස්තර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ දැක්විය යුතු ය. එනම්, ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණය යන ත්‍රිවිධ ආයතන වල සංයුතිය, සැකැස්ම, නියෝජනය, බලතල හා කාර්යයන්, එම ආයතන අතර ඇති අන්තර් සම්බන්ධය, එම ආයතන හා ජනතාව අතර ඇති සම්බන්ධය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වන මූලික නීතියේ අඩංගු විය යුතු ය.

## ● <u>අධිකරණයේ ස්වාධීනත්වය සම්බන්ධයෙන්.</u>

**අධිකරණයේ ස්වාධීනත්වය සම්බන්ධ තොරතුරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සටහන් කළ යුතු ය.** <u>අධිකරණයේ ස්වාධීනත්වය යනුවෙන් අදහස් කරණු ලබන්නේ, ව්‍යවස්ථාදායකයේ සහ විධායකයේ බලපෑමකින් හෝ මැදිහත් වීමකින් තොරව අධිකරණයට ක්‍රියාත්මක වීමට ඇති හැකියාවයි.</u> <u>අධිකරණයට කරණු ලබන **පත් කිරීම් - සේවා කාලය - ඉවත් කිරීම්** - වැටුප්</u> යන අංශ මත අධිකරණයේ ස්වාධීනත්වය රැකීමට කටයුතු කරයි. රාජ්‍යය කටයුතු සාධාරණව පැවතීමට අධිකරණයේ ස්වාධීනතාවය වැදගත් වේ. එම නිසා අධිකරණයේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් රටක මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්විය යුතු ය.

## ● <u>පුරවැසියාගේ මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන්.</u>

**පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්විය යුතු ය.** නූතනය තුළ සෑම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තුළම මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් අඩංගු වේ. <u>ප්‍රථම වරට මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ව්‍යවස්ථා ගත කරන ලද්දේ 1789 ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට</u> ය. මූලික අයිතිවාසිකම් කොටස් තුනකට බණ්ඩනය කළ හැකිය.

**අයිතිවාසිකම්**

| **සිවිල් අයිතිවාසිකම්** | **දේශපාලන අයිතිවාසිකම්** | **ආර්ථික අයිතිවාසිකම්** |
| --- | --- | --- |
| ජීවත් වීමේ අයිතිය | ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය | රැකියාවක් කිරීමේ අයිතිය |
| භාෂණයේ අයිතිය | දේශපාලන පක්ෂ නිර්මාණය කිරීමේ අයිතිය | රැකියාවක් නොකිරීමේ අයිතිය |
| ප්‍රකාශනයේ අයිතිය | කැමති දේශපාලන මත වාදයක් දැරීමේ අයිතිය | දේපළ රැස්කර ගැනීමේ අයිතිය |

## ● <u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන ආකාරය.</u>

(N.B ආණ්ඩු ක්‍රම වලට අදාළ Tute වල ව්‍යවස්ථා සංශෝධන විධිවිධාන අධ්‍යයනය කරන්න)

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරනු ලබන ආකාරය විශේෂයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්විය යුතු ය.** නම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සංශෝධනය කිරීම සඳහා භාවිත කරනු ලබන ක්‍රම එකිනෙට වෙනස් වේ.

**නිදර්ශන -:** නම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නම් සංශෝධනය කිරීමට ව්‍යවස්ථාදායකයේ සාමාන්‍ය නීති සම්පාදනය කරනු ලබන නෛතික ක්‍රියාවලියට හැකිය.එනම්, ව්‍යවස්ථාදායකයේ සරල බහුතරයක (1/2ක) අනුමැතිය මත ව්‍යවස්ථාව සංශෝධනය කළ හැකිය.

අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සංශෝධනය කිරීමට ව්‍යවස්ථාදායකයේ සරල බහුතරයකට (1/2 කට) නොහැකිය. ඒ සඳහා විශේෂ ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු ය. එනම්, ව්‍යවස්ථාදායකයේ විශේෂ බහුතරයක් - ප්‍රාන්තවල විශේෂ බහුතරයක් - ජනමත විචාරණයක් - විශේෂ සම්මේලන බහුතර අනුමැතියක් ආදී මූලධර්ම අවශ්‍ය වේ.

මෙම ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා කුමන ක්‍රියාමාර්ගයක් අනුගමනය කළ යුතු දැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්විය යුතු ය.

● <u>රාජ්‍ය ප්‍රතිපත්ති හා මූලධර්ම පිළිබඳව.</u>

**රාජ්‍යය ප්‍රතිපත්ති හා මූලධර්ම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්විය යුතු ය.** <u>රාජ්‍යය ප්‍රතිපත්ති යනුවෙන් අදහස් කරනු ලබන්නේ රාජ්‍යය නීති පනවන විටත් නීති ක්‍රියාත්මක කරන විටත් අනුශාසනා කරන විටත් භාවිතයට ගනු ලබන ප්‍රතිපත්තීන් ය.</u> පාලනයන්ටත් ජනතාවටත් රාජ්‍යය ප්‍රතිපත්ති සම්බන්ධ අවබෝධයක් ලැබීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළට රාජ්‍යය ප්‍රතිපත්ති අන්තර්ගත කළ යුතුය.

● <u>නියෝජන මූලධර්ම හා සිද්ධාන්ත පිළිබඳව.</u>

**නියෝජන මූලධර්ම සිද්ධාන්ත පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්විය යුතුය.** නූතන ජාතික රාජ්‍යයන් තුළ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වෙයි. එම නිසා නියෝජන මූලධර්ම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වීම වැදගත් වේ.

ඊට අදාළව ,

ජනතාව නියෝජිතයින් පත් කර ගන්නා ආකාරය
නියෝජිතයින්ගේ නිල කාලය
නියෝජනය කරන ප්‍රදේශ
නියෝජනය කරන අංශ
නියෝජිතයින් ඉවත් කරන ආකාරය

වැනි මූලධර්ම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ සටහන් කළ යුතුය.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් නොකළ යුතු කරුණු

හැඳින්වීම.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් නොකළ යුතු කරුණු ආණ්ඩුක්‍රම වේදීන් හා දේශපාලන විද්‍යාඥයින් දළ වශයෙන් පහත පරිදි දක්වයි.

1. ජන වර්ගයකට විශේෂ වරප්‍රසාද දෙන වගන්ති.
2. ජන වර්ග භේද කරන වගන්ති.
3. ආගම සම්බන්ධයෙන්.
4. ජාත්‍යන්තර භේදයකට තුඩු දිය හැකි කරුණු.
5. සිරිත් විරිත් සම්බන්ධ කරුණු.

● <u>ජන වර්ගයකට විශේෂ වරප්‍රසාද දෙන වගන්ති.</u>

**ජන වර්ගයකට විශේෂ වරප්‍රසාද දෙන කරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ අන්තර්ගත නොකළ යුතුය.** විශේෂයෙන් නූතන ජාතික රාජ්‍යයන් බහු ආගමික, බහු භාෂාමය, බහු වාර්ගික, බහු සංස්කෘතික, බහු වාර්නික රාජ්‍යයන් වේ. එම නිසා එක් වාර්ගික කොටසකට විශේෂ වරප්‍රසාද දෙන නීති (ව්‍යවස්ථා) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් නොකළ යුතු ය. එසේ දැක්වීම නිසා රාජ්‍යයන් තුළ වාර්ගික ගැටුම්, ආගමික ගැටුම්, වාර්ණික ගැටුම්, භාෂාමය ගැටුම්, සංස්කෘතික ගැටුම් ඇතිවිය හැකිය. එවැනි තත්ත්වයක් රාජ්‍යයේ සාමයට ආරක්ෂාවට අහිතකරය.

- <u>ජන වර්ග භේද කරන වගන්ති.</u>

ජන වර්ග භේද කරවන වගන්ති ව්‍යවස්ථාවකට ඇතුළත් නොකළ යුතු ය. ජන වර්ග බෙද වීම හරහා ජාතික රාජ්‍යයන් තුළ වාර්ගික ගැටුම් ඇති වේ. එය ජාතික සමගියට, ජාතික ආරක්ෂාවට, ජාතික සංවර්ධනය, බාධාකාරීය. එම නිසා ජාතීන් අතර සාමය සහයෝගීතාවය, සහෝදරත්වය, මිත්‍රත්වය බණ්ඩනය වන කිසිදු නීතියක් ව්‍යවස්ථාවට ඇතුළත් නොකළ යුතු ය.

- <u>ආගම සම්බන්ධයෙන්.</u>

ආගම සම්බන්ධ කරුණු ව්‍යවස්ථාවේ නොදැක්විය යුතුය. විශේෂයෙන් බහු ආගමික රාජ්‍යයන් තුළ ව්‍යවස්ථාව නිරාගමික එකක් විය යුතු ය. ආගම ගැන දැක්වීම එක් අතකින් ව්‍යවස්ථාව අනවශ්‍ය ලෙස දීර්ඝ වීමට හේතු වන අතර අනෙක් පසින් ආගමික ගැටුම්, යුද්ධ ඇති වීමට ද හේතු වේ. එම නිසා ආගම් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කරුණු නොදැක්විය යුතු ය.

- <u>ජාත්‍යන්තර භේදයකට තුඩු දිය හැකි කරුණු.</u>

ජාත්‍යන්තර භේදයකට තුඩු දෙන කරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් නොකළ යුතු ය. නූතන ජාතික රාජ්‍යයන්ට අන්තර් ජාතික සම්බධතා වලින් මිදිය නොහැකිය. එම නිසා ජාත්‍යන්තර භේදයකට තුඩු දිය හැකි ව්‍යවස්ථා (නීති) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අඩංගු නොකළ යුතු ය.

- <u>සිරිත් විරිත් සම්බන්ධ කරුණු.</u>

සිරිත්විරිත් සම්බන්ධයෙන් ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නොදැක්විය යුතු ය. සිරිත් විරිත් ව්‍යවස්ථා ගත කිරීම නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනවශ්‍ය දීර්ඝ ලේඛණයක් බවට පත් වේ. එය ව්‍යවස්ථාවේ පැහැදිලි භාවයට, සංක්ෂිප්ත භාවයට බාධකයකි. එම නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුලට සිරිත් විරිත් සම්බන්ධ මූලධර්ම අන්තර්ගත නොකළ යුතුය.

නිමාව.

ඉහත ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අඩංගු කළ යුතු හා නොකළ යුතු කරුණු සම්බන්ධයෙන් සටහන් තැබිය හැකිය. නූතන ජාතික රාජ්‍යයන් හි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා තුළ ඉහත කරුණු අඩු වැඩි වශයෙන් ව්‍යවස්ථා ගත කර තිබීම හඳුනාගත හැකිය. <u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අන්තර්ගත කළ යුතු කරුණු වැඩි ප්‍රමාණයක් ව්‍යවස්ථා ගත කර ඇති රාජය තුළ සංවර්ධනය, ජාතික සමගිය, ජාතික ආරක්ෂාව ඉහළ මට්ටමකින් පවතින බලවත් රාජ්‍යයන් බවට පත්ව තිබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් නොකළ යුතු කරුණු වැඩි ප්‍රමාණයක් ව්‍යවස්ථාවන්ට ඇතුළත් කර ඇති රාජ්‍යයන් ආර්ථික අතින් දුගී, නොපොහොසත්, ජාතික ආරක්ෂාව තහවුරු කර ගැනීමට අපහසු, ජාතික සමගිය බිඳ වැටුණු, අසංවර්ධිත දුබල රාජ්‍යයන් බවට පත්ව තිබේ.</u>

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක කාර්යභාරය

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක කාර්යභාරය

ප්‍රවේශය - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හඳුන්වන්න.
(පොදු නිර්වචන - දාර්ශනික නිර්වචන - ලක්‍ෂණ - නිදර්ශන මේසඳහා භාවිතා කරන්න.)

කරුණු -
1. දේශපාලන ක්‍රමයේ ස්වභාවය පෙන්නුම් කිරීම.
2. ආණ්ඩුවේ ස්වභාවය පෙන්නුම් කිරීම.
3. ආණ්ඩුවේ ත්‍රිවිධ ආයතන පිළිබඳ විස්තර දැක්වීම.
4. අඥාධායක පාලන ක්‍රම වලින් රට බේරා ගැනීම.
5. පුරවැසියාගේ නිදහස හා අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම.
6. දේශපාලන ස්ථාවර භාවය සැපයීම.
7. ජාතිය ගොඩනැගීම.

● <u>**දේශපාලන ක්‍රමයේ ස්වභාවය පෙන්නුම් කිරීම.**</u>

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ප්‍රධාන කාර්යයක් ලෙස මෙය දැක්විය හැකිය. **දේශපාලන ක්‍රමයේ ස්වභාවය යනුවෙන් සංකේතවත් වන්නේ රාජ්‍යයේ ස්වභාවය කුමක් ද යන්න වේ.** වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් <u>රාජ්‍යය විසින් පිළිගෙන ඇති දේශපාලන සහ ආර්ථික දෘෂ්ටිවාදය ප්‍රකාශ කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන කාර්යයක් වේ.</u>

**නිදර්ශන ලෙස -:** ලිබරල් රාජ්‍යයක් ද, සමාජවාදී රාජ්‍යයක් ද, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ද යන්න ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ දැක්විය යුතු ය. නිදසුන් ලෙස <u>1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ i පරිච්ඡේදයේ i වගන්තිය තුළ</u>

**"ශ්‍රී ලංකාව ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයකි."**

● <u>**ආණ්ඩුවේ ස්වභාවය පෙන්නුම් කිරීම.**</u>

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තවත් කෘත්‍යයක් ලෙස ආණ්ඩුවේ ස්වභාවය ප්‍රකාශනය කිරීම පෙන්වාදිය හැකිය.

**නිදර්ශන ලෙස -:** ඒකීය ආණ්ඩුක්‍රමයක් ද? සන්ධීය ආණ්ඩුක්‍රමයක් ද? විධායක බලය ක්‍රියාවට නංවන්නේ ජනාධිපති වරයෙක් ද? කැබිනට් මණ්ඩලයක් ද? මිශ්‍ර විධායකයක් ද? යන්න ප්‍රකාශ කළ යුතුය. නිදර්ශන ලෙස <u>1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ i පරිච්ඡේදයේ ii වගන්තිය තුළ.</u>

**"ශ්‍රී ලංකා ජන රජය, ඒකීය රාජ්‍යයකි."**

## • <u>ආණ්ඩුවේ ත්‍රිවිධ ආයතන පිළිබඳව විස්තර දැක්වීම.</u>

ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන ත්‍රිවිධ ආයතන වල සංයුතිය - බලතල හා කාර්යයන් - එම ආයතන අතර ඇති අන්තර් සම්බන්ධතාවය - එම ආයතන හා මහජන තාව අතර ඇති සම්බන්ධතාවය ඉතා පැහැදිලිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක දැක්විය යුතු ය. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තවත් ප්‍රධාන කෘත්‍යයකි.

## • <u>අඥාධායක පාලන ක්‍රම මගින් රට බේරා ගැනීම.</u>

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සතු ඉතාම වැදගත් තවත් කාර්යයක් වන්නේ ආඥාදායක පාලන ක්‍රම වලින් රාජ්‍යය බේරා ගැනීමයි. **අත්තනෝමතික - අඥාධායක - ඒකාධිපති - හිංසාකාරී - පීඩාකාරී පාලන ක්‍රම උත්පාද වීම ලොප් කිරීම ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක ප්‍රධානම කෘත්‍ය වේ.** ව්‍යවස්ථානුකූල නිතිය මගින් එවැනි පාලන තන්ත්‍ර උත්පාද වීමට ඇති අවකාශය සිමා කළ යුතු ය. **බලය සංවරණය කිරීමේ උපාය, උපක්‍රම ව්‍යවස්ථාව තුළ ඉතා ශක්තිමත්ව දක්වා තිබිය යුතු ය.** ඒ හරහා ආඥාදායක පාලන ක්‍රම වලින් රට මුදවා ගැනීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සතු ප්‍රධාන කාර්යය වේ.

## • <u>පුරවැසියාගේ නිදහස හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.</u>

පුරවැසියාගේ නිදහස හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ තහවුරු කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ප්‍රධාන කාර්යයක් වේ. පුරවැසියන්ට නිදහස අයිතිවාසිකම් හිමි වීමට නම් ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් ස්ථාපනය කර තිබිය යුතු ය. එසේම එම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අධිකරණයට බලය පවරා තිබිය යුතු ය.

**නිදර්ශන ලෙස -:** ප්‍රථමයෙන් මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ආණ්ඩුක්‍රමයකට ඇතුළත් කළේ 1789 දී ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අයිතිවාසිකම් <u>ප්‍රධාන කොටස් තුනකි</u>.

**අයිතිවාසිකම්**

| **සිවිල් අයිතිවාසිකම්** | **දේශපාලන අයිතිවාසිකම්** | **ආර්ථික අයිතිවාසිකම්** |
|---|---|---|
| ජීවත් වීමේ අයිතිය | ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය | රැකියාවක් කිරීමේ අයිතිය |
| භාෂණයේ අයිතිය | දේශපාලන පක්ෂ නිර්මාණය කිරීමේ අයිතිය | රැකියාවක් නොකිරීමේ අයිතිය |
| ප්‍රකාශනයේ අයිතිය | කැමති දේශපාලන මත වාදයක් දැරීමේ අයිතිය | දේපළ රැස්කර ගැනීමේ අයිතිය |

## • <u>දේශපාලන ස්ථාවර භාවය සැපයීම.</u>

රාජ්‍යයක දේශපාලන ස්ථාවර භාවය ස්ථාපනය වී ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මතය. රාජ්‍යය ගමන් කළ යුතු දිශානතිය, පාලකයින් තෝරාපත් කර ගන්නා ආකාරය, නිල කාලය, ඉවත් කරන ආකාරය, නියෝජන මූල ධර්මයන් ආදිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ සටහන් කරයි. එම නිසා එම කාර්යයන් ඉතා විදිමත්ව ක්‍රියාත්මක වේ. පාලකයා මෙන්ම පාලිතයන් ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල විය යුතු ය. මෙම ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමස්ත දේශපාලන ක්‍රියාවලියේම මූල පද්ධතිය බවට පත් වෙමින් දේශපාලන ස්ථාවර භාවය ගොඩනගයි.

• <u>ජාතිය ගොඩනැගීම.</u>

ජාතිය ගොඩනැගීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකින් ඉටු විය යුතු තවත් වැදගත් කාර්යයකි. දේශපාලන විද්‍යාව තුළ ජාතිය යන භාෂාමය වාග් සංකේතයෙන් සංකේතවත් වන්නේ ජාතික රාජ්‍යයක් තුළ ජීවත් වන පුරවැසියන් ය. මෙම පුරවැසියන් බොහෝවිට බහු වාර්ගික - බහු භාෂාමය - බහු ආගමික - බහු වාර්ණික - බහු සංස්කෘතිය හැඩතල සහිතය. මෙවැනි විවිධත්වයක් පවතින විට ජාතිකත්වය ඉස්මතු වීමට වඩා වාර්ගිකත්වය ඉස්මතු වේ. එම නිසා ජාතිකත්වය ඉස්මතු කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම **සමාන පුරවැසියන් - සමාන ඉඩ ප්‍රස්ථාවන්** යන සිද්ධාන්තය ස්ථාපනය කළ යුතුය. ඒ හරහා රාජ්‍යයේ පුරවැසියන්ගේ මනස තුළ ජාතිය, ජාතිකත්වය වැනි මනෝ භාවයන් උත්පාද කළ හැකිය.

නිදර්ශන ලෙස -: මේ සඳහා විශේෂ ජන වර්ගයකට ආගමකට, භාෂාවකට වරප්‍රසාද දෙන නීති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත නොකළ යුතු ය. නිදසුන් ලෙස <u>1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 29(2) 29(3) උප වගන්ති දැක්විය හැකිය.</u>

ජාතිය ගොඩ නැගීම සඳහා තව දුරටත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් **ඒකීය දේශපාලන දර්ශනයක් ඒකීය ආර්ථික දර්ශනයක්** සැපයිය යුතු ය.

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ගීකරණය

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ගීකරණය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් විවිධ වර්ගීකරණ ඉදිරිපත් වී ඇත. වර්තමානය තුළ භාවිත වන ප්‍රධාන වර්ගීකරණ කිහිපයකි. **ඒවා නම්,**

(i) **ලිඛිත** - **නිර්ලිඛිත** ව්‍යවස්ථා
(ii) **නම්‍ය** - **අනම්‍ය** ව්‍යවස්ථා
(iii) **ඒකීය** - **සන්ධීය** ව්‍යවස්ථා

## ලිඛිත - නිර්ලිඛිත (අලිඛිත) ව්‍යවස්ථා

● **ලිඛිත හා නිර්ලිඛිත** ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ග කිරීමේ පදනම

ලිඛිත හා නිර්ලිඛිත ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ගීකරණය **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ස්වභාවය** මත පදනම් වෙමින් බ්‍රයිස් සාමිවරයා විසින් ඉදිරිපත් කොට තිබේ.

## ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

● ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු **කුමක්දැයි හැඳින්වීම**.

**ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්දැයි නිර්වචනය කරන්නේ නම්,** මූලිකව, ලියන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ලෙස හඳුනාගත හැකිය. **තවදුරටත්,** රාජ්‍යය පාලනය කරනු ලබන ආකාරය පිළිබඳ විස්තර ක්‍රමානුකූල ලේඛණයක ලියා දක්වා ඇති ව්‍යවස්ථා ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වේ. **වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම දක්වන්නේ නම්,** ආණ්ඩුක්‍රමයක සංවිධානය පිළිබඳව පවතින මූලික නීති තනි ලේඛණයක් වශයෙන් ලියවී ඇත්නම් එය ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වේ.

● ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ලක්ෂණ.

ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පවතින රාජ්‍යයන්හි ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන ත්‍රිවිධ ආයතන සම්බන්ධ විස්තර ක්‍රමානුකූලව ව්‍යවස්ථාව තුළ අන්තර්ගත කොට තිබීම - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනම්‍යය පදනමක රඳවා තිබීම ආදී ලක්ෂණ හඳුනාගත හැකිය.

● ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අදාළ නිදර්ශන.

ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අදාළව ලෝක දේශපාලනය තුළින් ඉදිරිපත් කළ හැකි ශක්තිවන්ත නිදර්ශන ලෙස,

ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

● <u>ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් තුල ඇති නිර්ලිඛිත කරුණු.</u>

ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක වුවද ලිඛිත කරුණු තරම් බලවත් අලිඛිත (නිර්ලිඛිත) කරුණු පවතී. ඒවා **ආණ්ඩුක්‍රම සම්ප්‍රදායන්** ලෙස හඳුන්වයි. **සම්ප්‍රදායන් යනුවෙන් අදහස් වන්නේ ආණ්ඩුක්‍රමය දීර්ඝ කාලයක් ක්‍රියාත්මක වීම හරහා එයට කාලය විසින් එකතු කරනු ලබන සිරිත් විරිත් චාරිත්‍ර වාරිත්‍ර වැනි සංකල්පයන්ය.** <u>ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් තුළ හඳුනාගත හැකි අලිඛිත කරුණු වලට නිදර්ශන</u>.

නිදර්ශන -: <u>ඇමරිකානු කැබිනට් ලේකම් මණ්ඩලය</u> සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කිසිදු කරුණක් සඳහන් නොවේ. නමුත් වර්තමානය වන විට ආණ්ඩුක්‍රම සම්ප්‍රධායක් ලෙස අලිඛිතව ඉතා බලවත් සංකල්පයක් ලෙස ඇමරිකානු කැබිනට් ලේකම් මණ්ඩලය නිර්මාණය වී තිබේ.

ඇමරිකානු ආණ්ඩුක්‍රමය නිර්මාණය කිරීමේ දී ත්‍රිවිධ ආයතන අතර සම්බන්ධය දුරස්ථ කිරීමට <u>බලතල බෙදීමේ න්‍යාය</u> මගින් උත්සාහ දරා ඇත. නමුත් වර්තමානය වන විට එම ත්‍රිවිධ ආයතන අතර ඉතා සමීප සම්බන්ධතාවයක් නෛතික මට්ටමින් නොවූන ද සම්ප්‍රදායක් ලෙස නිර්මාණය වී පවතී.

● <u>ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නිර්මාණය වීමට අදාළ හේතු</u>.

ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්බන්ධ සංවාදය තුළ දී ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් බිහිවීමට අදාළ තත්ත්වයන් (හේතු) සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම වැදගත් වේ.

(i) **ක්‍රමවත්ව පාලනය වූ සමාජයක් බිඳ වැටීමෙන් පසු ඊට සම්පූර්ණයෙන්ම වෙනස් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ආරම්භයේ දී නව ආණ්ඩුක්‍රමය පිළිබඳ අවබෝධයක් ජනතාවට ලබා දීමටත් පැරණි ක්‍රමයෙන් වෙනස් වීමේ ස්වභාවය පෙන්වා දීමටත් අවශ්‍ය වීම ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් බිහි වීමට හේතු විය.**

නිදර්ශන -: 1789 ප්‍රංශ ඒකාධිපති රාජාණ්ඩුව බිඳ දමා ප්‍රංශ විප්ලවයෙන් පසු බිහි කළ ප්‍රංශ සමූහාණ්ඩු ව්‍යවස්ථාව.

1917 බොල්ෂවික් විප්ලවයෙන් සාර් රාජාණ්ඩුව බිඳ දමා පිහිට වූ එක්සත් සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

(ii) **සංඝීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් බිහිවීම.**

ලෝක දේශපාලනය තුළ සංඝීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් නිර්මාණය විම ද ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් බිහි වීමට බලපෑ ප්‍රධාන හේතුවක් විය. සංඝීය ක්‍රමයක් තුළ මධ්‍ය හා ප්‍රාන්ත ආණ්ඩු අතර බලතල බෙදා දැක්වීමට ලිඛිත ආණ්ඩුක්‍රමයක් අතවශ්‍ය විය.

නිදර්ශන -: ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ **මධ්‍ය ආණ්ඩුව සතු බලතල ලැයිස්තුව - ප්‍රාන්ත ආණ්ඩුව සතු බලතල ලැයිස්තුව - සමගාමී බලතල ලැයිස්තුව** ආදී ලෙස බලතල වෙන් වෙන්ව ලේඛණ ගත කිරීම.

(iii) **විදේශීය ආධිපත්‍යයන්ගෙන් මිදී ජාතික නිදහස දිනාගත් රාජ්‍යයන් නව ආණ්ඩුක්‍රමයක් මගින් ස්වකීය නිදහස හා අයිතිවාසිකම් ආරක්ෂා කරගෙන එය ස්ථාවරව හා විධිමත්ව පවත්වාගෙන යෑමේ අවශ්‍යතාවය.**

**නිදර්ශන -:** ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.
ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය වීමට ඉහත හේතු සාධකයන් එකක් හෝ කිහිපයක් එකවිට බලපෑ හැකිය.

● ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක හඳුනාගත හැකි වාසි හා අවාසි.

ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ කථිකාව තුළ දී එහි වාසි (වැදගත් භාවය) - අවාසි (දුර්වලතා) සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම වැදගත් ය.

| වාසි (වැදගත්කම) | අවාසි (දුර්වලතා) |
|---|---|
| ○ පුරවැසියාගේ නිදහස හා අයිතිවාසිකම් ආරක්ෂා වීමට හේතු වීම.<br>○ බිඳ වැටීම් තොර ශක්තිමත් පරිපාලනයක් ඇති කර ගැනීමට හැකි වීම.<br>○ පාලකයන්ට පවත්වාගෙන යා යුතු පාලන ක්‍රමය සම්බන්ධයෙන් අවබෝධයක් ලැබීම.<br>○ පාලිතයන්ට පවතින පාලන ක්‍රමය සම්බන්ධයෙන් අවබෝධයක් ලැබීම.<br>○ බලතල පදනම් කොට ගෙන ගැටුම් ඇති නොවීම.<br>○ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අධ්‍යයනය කිරීමට හැකි වීම.<br>○ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළනාත්මකව සංසන්දනය කිරීමට වාසි අවාසි හඳුනා ගැනීමට හැකි වීම.<br>○ පාලකයන්ට ව්‍යවස්ථාවට අනුව පාලන කටයුතු සිදු කිරීමට සිදු වීම | ○ වෙනස්වන සමාජ, ආර්ථික, දේශපාලන අවශ්‍යතාවයන්ට අනුව ව්‍යවස්ථාව වෙනස් කරමින් පවත්වාගැනීම අපහසු වීම.<br>○ හදිසි අර්බුද වලට මුහුණ දීමට අපහසු වීම. |

**අලිඛිත (නිර්ලිඛිත) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා**

● **නිර්ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්දැයි හැඳින්වීම.**

**නිර්ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්දැයි නිර්වචනය කරන්නේ නම්, මූලිකව,** නොලියන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ලෙස හඳුනාගත හැකිය. **තවදුරටත්,** රාජ්‍ය පාලනය කරනු ලබන ආකාරය පැහැදිලිව, ක්‍රමානුකූලව ලේඛන ගත කර නොමැති ව්‍යවස්ථා නිර්ලිඛිත ව්‍යවස්ථා වේ. **වචනයේ පරිසමාප්ත අර්ථයෙන් දක්වන්නේ නම්** ආණ්ඩුක්‍රමය සංවිධානය පිළිබඳ පවතින මූලික නීති තනි ලේඛණයක් වශයෙන් ලේඛණ ගත වී නොමැති ව්‍යවස්ථා නිර්ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වේ.

● <u>නිර්ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හඳුනාගත හැකි ලක්ෂණ</u>.

නිර්ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පවතින රාජ්‍යයක ව්‍යවස්ථාදායක විධායක හා අධිකරණ යන ත්‍රිවිධ ආයතන සම්බන්ධ විස්තර ක්‍රමානුකූලව ලේඛණ ගත කර නොතිබීම - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම්‍ය පදනමක රඳවා තිබීම ආදී ලක්ෂණ හඳුනාගත හැකිය.

● <u>නිර්ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් සඳහා නිදර්ශන</u>.

නිර්ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අදාළව ලෝක දේශපාලනය තුළ සැපයිය හැකි ශක්තිවන්ත නිදර්ශනය වන්නේ **බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි.**

● <u>නිර්ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් තුළ හඳුනාගත හැකි ලිඛිත කරුණු</u>.

නිර්ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක වුවද ලිඛිත කරුණු යම් ප්‍රමාණයක් පවතී. **බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්ලිඛිත ව්‍යවස්ථාවක් නිසා විවිධ නීතී - සම්ප්‍රදායන් - පූර්වාදර්ශයන් ආදිය ගුරු කොට ගෙන ක්‍රියාත්මක වුව ද එය තුළ ලිඛිත කරුණු ව්‍යවස්ථාමය ලේඛණ ක්‍රියාත්මක වේ.**

නිදර්ශන -: මැග්නාකාටා පනත - අයිතිවාසිකම් පනත - අයිතිවාසිකම් පෙත්සම - ප්‍රතිසංස්කරණ පනත - නිරාකරණ පනත - පාර්ලිමේන්තු පනත - වෙස්මිනිස්ටර් ප්‍රඥප්තිය.

තවදුරටත් බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මකවීමේ දී භාවිතයට ගැනෙන ලිඛිත මූලාශ්‍ර කිහිපයකි. **නීති ග්‍රන්ථ - දේශපාලන න්‍යාය ධර්ම - ඉතිහාස ග්‍රන්ථ - රාජ්‍යය පාලකයන් ගැන ලියැවුණ චරිත කතා - හැන්සාඩ් වාර්තා - ආණ්ඩුක්‍රමය සම්බන්ධ ලිපි - රාජ්‍යය ප්‍රකාශන.**

● <u>නිර්ලිඛිත ව්‍යවස්ථාවක හඳුනාගත හැකි වාසි හා අවාසි</u>.

නිර්ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ කථිකාව තුළ දී නිර්ලිඛිත ව්‍යවස්ථාවක වාසි (වැදගත්කම්) - අවාසි (දුර්වලතා) සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම වැදගත් වේ.

| වාසි (වැදගත්කම) | අවාසි (දුර්වලතා) |
|---|---|
| o වෙනස්වන සමාජ ආර්ථික, දේශපාලන තත්ත්වයන්ට අනුව ව්‍යවස්ථාව වෙනස් කරමින් පවත්වාගැනීමට හැකිවීම.<br>o හදිසි අර්බුද වලට මුහුණ දීමට පහසු වීම. | o පවත්වා ගත යුතු පාලන ක්‍රමය සම්බන්ධයෙන් පාලකයන්ට මග පෙන්වීමක් නොමැති වීම.<br>o පවතින පාලන ක්‍රමය සම්බන්ධයෙන් පාලිතයන්ට අවබෝධයක් නොමැති වීම.<br>o අත්තනෝමතික පාලන ක්‍රමය නිර්මාණය වීමට හැකිවීම.<br>o ජනතාවගේ නිදහස අයිතිවාසිකම් අහිමිවීමට හැකිවීම.<br>o බලතල සම්බන්ධයෙන් ගැටලු ඇති විය හැකි වීම.<br>o ව්‍යවස්ථාව අධ්‍යයනය කිරීමට නොහැකි වීම.<br>o ව්‍යවස්ථාව තුලනාත්මකව සංසන්දනය කර මින් වාසි අවාසි හඳුනා ගැනීමට නොහැකි වීම.<br>o පරිපාලනයේ බිඳ වැටීම් ඇතිවිය හැකි වීම.<br>o ව්‍යවස්ථානුකූල පාලනයන් ඇති නොවීම. |

● <u>ලිඛිත හා නිර්ලිඛිත ව්‍යවස්ථා සම්බන්ධයෙන් එළඹිය හැකි නිගමනය</u>.

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ස්වභාවය මත පදනම් වී සිදු කරන ලද ලිඛිත හා නිර්ලිඛිත ව්‍යවස්ථා වර්ගීකරණය අර්ථාන්විත – පරිපූර්ණ වර්ගීකරණයක් ලෙස නිගමනය කළ නොහැකි ය. ඊට අදාළ හේතු සාධක වන්නේ, <u>ලිඛිත ව්‍යවස්ථා තුළ අලිඛිත කරුණු ක්‍රියාත්මක වීමත් නිර්ලිඛිත ව්‍යවස්ථා තුළ ලිඛිත කරුණු ක්‍රියාත්මක වීමත් ය</u>. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම්, නූතන ජාතික රාජ්‍ය තුළ වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ලිඛිත හෝ නිර්ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් ක්‍රියාත්මක නොවේ. එම නිසා එළඹිය හැකි අවසාන පොදු නිගමනය වන්නේ, ලිඛිත – නිර්ලිඛිත ව්‍යවස්ථා වර්ගීකරණය අර්ථාන්විත, පරිපූර්ණ, විද්‍යාත්මක ව්‍යවස්ථා වර්ගීකරණයක් නොවන බවයි.*

## නම්‍ය - අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

● <u>නම්‍ය හා අනම්‍ය ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ග කිරීමේ පදනම</u>

නම්‍ය හා අනම්‍ය ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ගීකරණය ආණ්ඩුක්‍රම ව්‍යස්ථාව සංශෝධන ක්‍රියාවලිය මත පදනම් වී <u>බ්‍රයිස් සාමි වරයා</u> විසින් ඉදිරිපත් කරයි.

## නම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

● <u>නම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්දැයි හැඳින්වීම</u>.

නම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්දැයි නිර්වචනය කිරීම. මූලිකව, <u>පහසු ක්‍රියාවලියකින් සංශෝධනය කළ හැකි ව්‍යවස්ථා නම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ලෙස හඳුනාගත හැකිය</u>. මෙය නෛතික පදනමකින් විග්‍රහ කරන්නේ නම්, <u>ව්‍යවස්ථාදායකයේ (1/2 කින්) එනම්, සරල බහුතරයකින් ව්‍යවස්ථාව සංශෝධනය කළ හැකි නම් එය නම්‍ය ව්‍යවස්ථාවක් ලෙස දැක්විය හැකි ය</u>.

● <u>නම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ලක්ෂණ</u>.

නම්‍ය ආණ්ඩුක්‍රම සම්බන්ධ කතිකාව තුළ දී නම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවකට අදාළ ලක්ෂණ සම්බන්ධයෙන් ද අවධානය යොමු කළ යුතු ය. ඒවානම්,

(i) ආණ්ඩුක්‍රම ව්‍යස්ථාව සංශෝධනය සම්බන්ධයෙන් පූර්ණ බලතල ව්‍යවස්ථාදායකය සතු වීම.

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය සඳහා විශේෂ ක්‍රියාමාර්ග ගත යුතු නො වීම.

(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතැම් වගන්ති සංශෝධනය කිරීම සම්බන්ධයෙන් සීමාවන් දක්වා නොතිබීම.

● <u>නම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අදාළ නිදර්ශන</u>.

නම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අදාළව ඉදිරිපත් කළ හැකි ශක්තිවන්ත නිදර්ශනයක් ලෙස බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යස්ථාව දැක්විය හැකිය.

● <u>නම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රායෝගික තලය තුළ අනම්‍ය ස්වභාවයක් ගනී</u>.

**න්‍යායික තලයේ දී - ආණ්ඩුක්‍රම නීතියට අනුව බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම්‍ය පදනමක රඳවා තිබේ.** ව්‍යවස්ථාදායකය පාර්ලිමේන්තුවේ (1/2 ක) සරල බහුතරයකින් ව්‍යවස්ථාව සංශෝධන යෝජනාව ස්ථිර කළ හැකි අතර නාමික විධායකයේ අවසාන අනුමැතිය සමඟ එය සම්මත වේ. මෙම ආකාරයට ආණ්ඩුක්‍රම නීතියට අනුව බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම්‍ය ස්වභාවයක් ගනී. නමුත් **ප්‍රායෝගික භාවිතාව තුළ බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දැඩි අනම්‍ය ස්වභාවයක් ගනී.** සම්ප්‍රදාය ගරුක පුරවැසියන් ජීවත්වන බ්‍රිතාන්‍යය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනයට අවකාශය පවතින්නේ ඉතා අවම මට්ටමකිනි.

**නිදර්ශන -:** රජ පදවිය - සාමි මන්ත්‍රී මණ්ඩලය වැනි ආයතන යල් පැන ගිය ප්‍රජාතන්ත්‍ර විරෝධී ආයතන ලෙස විචාරකයින් දැක්වුව ද එම ආයතන සම්බන්ධ කිසිදු සංශෝධනයකට බ්‍රිතාන්‍ය ජාතිකයෝ එකඟ නොවෙති. මෙම ආකාරයට ආණ්ඩුක්‍රම නීතියට අනුව නම්‍ය තලයක රඳවා ඇති බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රායෝගික භාවිතය තුළ දැඩි අනම්‍ය ස්වභාවයක් ගනී.

● <u>නම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක හඳුනාගත හැකි වාසි හා අවාසි</u>.

නම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ කතිකාව තුළ දී නම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක වාසි (වැදගත්කම්) - අවාසි (දුර්වලතා) සම්බන්ධයෙන් අවධානය කළ යුතු ය.

| වාසි (වැදගත්කම) | අවාසි (දුර්වලතා) |
|---|---|
| o වෙනස්වන මහජන මතයට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට පහසු වීම.<br>o හදිසි අර්බුද වලදී ව්‍යවස්ථාව සංශෝධනය කරමින් එයට මුහුණ දීමට හැකි වීම.<br>o වෙනස් වන සමාජ, ආර්ථික, දේශපාලන තත්ත්වයන්ට අනුව ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට පහසු වීම. | o නිතර ව්‍යවස්ථාව සංශෝධනය කරමින් පාලකයන්ට බලතල වර්ධනය කර ගැනීමට හැකි වීම.<br>o අත්තනෝමතික පාලන ක්‍රම බිහිවීමට ඇති අවකාශය වැඩි වීම.<br>o පුරවැසියාගේ නිදහස හා අයිතීන් ආරක්ෂාව සම්බන්ධයෙන් අහිතකර වීම.<br>o නිතර නිතර ව්‍යවස්ථා සංශෝධනය නිසා පරිපාලනයේ බිඳ වැටීම් ඇති වීමට ඇති අවකාශය වැඩි වීම. |

## අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

● <u>අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්දැයි හැඳින්වීම</u>.

**අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්දැයි නිර්වචනය කිරීම.** මූලිකව, <u>පහසු ක්‍රියාවලියකින් සංශෝධනය කළ නොහැකි ව්‍යවස්ථා අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ලෙස හඳුනාගත හැකිය</u>. මෙය **නෛතික පදනමකින් විග්‍රහ කරන්නේ නම්,** <u>ව්‍යවස්ථාදායකයේ (1/2 කින්) එනම්, සරල බහුතරයකින් ව්‍යවස්ථාව සංශෝධනය කළ නොහැකි නම් ඒ සඳහා විශේෂ ක්‍රියාමාර්ග ගත යුතු නම් එවැනි ව්‍යවස්ථා අනම්‍ය ව්‍යවස්ථාවක් ලෙස දැක්විය හැකි ය</u>.

● <u>අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ලක්ෂණ</u>.

අනම්‍ය ආණ්ඩුක්‍රම සම්බන්ධ කතිකාව තුළ දී අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අදාළ ලක්ෂණ සම්බන්ධයෙන් ද අවධානය යොමු කළ යුතු ය. **ඒවානම්,**

(i) **ආණ්ඩුක්‍රම ව්‍යස්ථාව සංශෝධනය සම්බන්ධයෙන් පූර්ණ බලතල ව්‍යවස්ථාදායකයට හිමි නොවීම.**

(ii) **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය සඳහා විශේෂ ක්‍රියාමාර්ග ගත යුතු වීම.** **<u>මෙම විශේෂ ක්‍රියාමාර්ග කොටස් හතරකින් යුක්ත වේ.</u>**

1. *ව්‍යවස්ථාදායකයේ (2/3 ක) විශේෂ බහුතරයක් අවශ්‍ය වීම.*
2. *ජනමත විචාරණයකදී ජනතාවගේ බහුතර අනුමැතිය අවශ්‍ය වීම.*
3. *ප්‍රාන්ත හෝ ප්‍රාදේශීය පාලන ඒකක වල බහුතර අනුමැතිය අවශ්‍ය වීම.*
4. *විශේෂ සම්මේලනයක බහුතර අනුමැතිය අවශ්‍යය වීම.*

(iii) **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතැම් වගන්ති සංශෝධනය කිරීම සම්බන්ධයෙන් සීමාවන් දක්වා තිබීම.**

● <u>අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අදාළ **නිදර්ශන**</u>.

අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අදාළව ඉදිරිපත් කළ හැකි ශක්තිවන්ත නිදර්ශන ලෙස **ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යස්ථාව - ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව** දැක්විය හැකිය.

● <u>අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රායෝගික තලය තුළ **නම්‍ය ස්වභාවයක් ගනී**</u>.

**ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව න්‍යායික තලය තුළදී අනම්‍ය පදනමක ස්ථාපනය කර තිබේ.** ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය සඳහා ව්‍යවස්ථාදායකය කොංග්‍රස් මණ්ඩලයේ (2/3 ක ) විශේෂ බහුතර අනුමැතිය සහ ප්‍රාන්ත (3/4 ක) අනුමැතිය අවශ්‍ය වේ. මෙම ආකාරයට ආණ්ඩුක්‍රම නීතියට අනුව ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනම්‍ය වේ. **නමුත් ප්‍රායෝගික භාවිතය තුළ දී ඇමරිකානු ව්‍යවස්ථාව නම්‍ය ස්වභාවයක් ගනී.**

නිදර්ශන - ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධන 26 ක් එකතුවීමෙන් එය පැහැදිලි වේ.

1978 ශ්‍රී ලාංකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව න්‍යායික තලයේදී එනම් ආණ්ඩුක්‍රම නීතියට අනුව අනම්‍ය පදනමක ස්ථාපනය කර තිබේ. මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධන විධිවිධාන ආකාර දෙකකි.

**(i)** ක්‍රමය - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1 - 2 - 3 - 6 - 7 - 8 - 9 - 10 - 11 - 30(2) - 62(2) දරණ වගන්ති සංශෝධනය සඳහා ව්‍යවස්ථාදායකයේ (2/3) ක විශේෂ බහුතර අනුමැතියට අමතරව ජනමත විචාරණයකදී ජනතාවගේ බහුතර අනුමැතිය අවශ්‍යය වේ.

## පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

● <u>පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථායක් යනු කුමක්දැයි හැඳින්වීම.</u>

ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලයක් විසින් නිශ්චිත කාලසීමක් තුළදී නිර්මාණය කරන ලද ව්‍යවස්ථා පනවන ලද හෙවත් නීතියෙන් බිහිවූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ලෙස නිර්වචනය කළ හැකිය.

● <u>පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථායක ලක්ෂණ</u>

පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අදාළව හඳුනාගත හැකි ප්‍රධානම ලක්ෂණ කිහිපයකි. **ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වීම - නෛතික මට්ටම තුළ අනම්‍ය ස්වභාවක් ගැනීම. - ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් විසින් සම්පාදනය කිරීම.**

● <u>පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අදාළ නිදර්ශන</u>

පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අදාළව සැපයිය හැකි ශක්තිවන්ත නිදර්ශන, **ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

● <u>පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක හඳුනාගත හැකි වාසි හා අවාසි</u>.

පනවන ලද ව්‍යවස්ථා සම්බන්ධ කතිකාව තුළ දී පනවන ලද ව්‍යවස්ථාවක වාසි (වැදගත්කම්) - අවාසි (දුර්වලතා) සම්බන්ධයෙන් අවධානය කළ යුතු ය.

| වාසි (වැදගත්කම) | අවාසි (දුර්වලතා) |
|---|---|
| o අවශ්‍යය ආකාරයට නිර්මාණය කිරීමට හැකිවීම.<br>o පාලනය කරන ලද තත්ත්වයන් යටතේ ව්‍යවස්ථාව සම්පාදනය කිරීමට හැකිවීම.<br>o පනවන ලද ව්‍යවස්ථා ලිඛිත වේ. එම නිසා ලිඛිත ව්‍යවස්ථාවක වාසි මීට අදාළ වේ.<br>o පනවන ලද ව්‍යවස්ථා අනම්‍යය වේ. එම නිසා අනම්‍ය ව්‍යවස්ථාව ක වාසි මීට අදාළ වේ. | o පනවන ලද ව්‍යවස්ථා ලිඛිත වේ. එම නිසා ලිඛිත ව්‍යවස්ථාවක අවාසි මීට අදාළ වේ.<br>o පනවන ලද ව්‍යවස්ථා අනම්‍ය වේ. එම නිසා අනම්‍ය ව්‍යවස්ථාවක අවාසි මීට අදාළ වේ.<br>o පනවන ලද ව්‍යවස්ථා උත්තරාරෝපිත හැඩයක් දරණ නිසා ඇතැම් විට රාජ්‍යය තුළ පවතින සංස්කෘතික තත්ත්වයන් වලට එය නොගැලපිය හැකිය. |

● <u>විකාශිත හා පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්බන්ධයෙන් එළඹිය හැකි නිගමනය</u>

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය වී ඇති ආකාරය මත පදනම් වී සිදු කර ඇති මෙම වර්ගීකරණය පරිපූර්ණ වර්ගීකරණයක් නොවේ. <u>ඊට හේතුව විකාශිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුළ නීතයෙන් පැනවූ කරුණු ද පනවන ලද ව්‍යවස්ථා තුළ සම්ප්‍රදාය මත බිහිවූ විකාශිත කරුණු ද අන්තර්ගත වීමයි.</u>*

**(ii) ක්‍රමය** - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **1 - 2 - 3 - 6 - 7 - 8 - 9 - 10 - 11 - 30(2) - 62(2)** දරණ වගන්ති හැර සෙසු වගන්ති සංශෝධනය සඳහා ව්‍යවස්ථාදායකයේ (2/3) ක විශේෂ බහුතර අනුමැතිය පමණක් අවශ්‍යය වේ.

මෙම ආකාරයට 1978 ශ්‍රී ලාංකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනම්‍ය පදනමක ස්ථාපනය කර තිබුණ ද ප්‍රායෝගික භාවිතය තුළ නම්‍ය ස්වභාවයක් නිරූපණය වේ. මේ වන විට ව්‍යවස්ථාව 18 වතාවක් සංශෝධනය වීමෙන් එය පැහැදිලි වේ.

● අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක හඳුනාගත හැකි වාසි හා අවාසි.

අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ කතිකාව තුළ දී අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක වාසි (වැදගත්කම්) - අවාසි (දුර්වලතා) සම්බන්ධයෙන් අවධානය කළ යුතු ය.

| වාසි (වැදගත්කම) | අවාසි (දුර්වලතා) |
| --- | --- |
| o ව්‍යවස්ථාව සංශෝධනය කරමින් පාලකයන්ට බලය වර්ධනය කරගැනීමට අපහසුවීම.<br>o අත්තනෝමතික පාලනයක් නිර්මාණයවීමේ අවකාශය සීමාවීම.<br>o ජනතාවගේ නිදහස හා අයිතීන් ආරක්ෂා වන ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතීම.<br>o නිතර නිතර ව්‍යවස්ථා සංශෝධනය මගින් පරිපාලනයේ බිඳවැටීම් ඇති නොවීම. | o වෙනස් වන සමාජ - ආර්ථික -දේශපාලනික තත්ත්වයන්ට ව්‍යවස්ථාව සංශෝධනය කරමින් මුහුණදීමට අපහසුවීම.<br>o හදිසි අර්බුධයන්ට ව්‍යවස්ථා සංශෝධනය කරමින් මුහුණදීමට ඇතිවන ප්‍රමාදය |

● **නම්‍ය හා අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්බන්ධයෙන් එළඹිය හැකි නිගමනය**

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය මත පදනම් ව නම්‍ය හා අනම්‍ය ලෙස ඉදිරිපත් කර ඇති වර්ගීකරණය අර්ථාන්විත – පරිපූර්ණ – වර්ගීකරණයක් ලෙස නිගමනය කළ නොහැකිය. ඊට හේතු සාධක වන්නේ ආණ්ඩුක්‍රම නීතියට අනුව නම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රායෝගික භාවිතය තුළ අනම්‍ය ස්වභාවයක් ගැනීමත් ආණ්ඩුක්‍රම නීතියට අනුව අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් ප්‍රායෝගික භාවිතය තුළ නම්‍ය ස්වභාවයක් ගැනීම නිසාය. එම නිසා එළඹිය හැකි නිගමනය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධන ක්‍රියාවලිය මත පදනම්ව සිදුකොට ඇති නම්‍ය හා අනම්‍ය ව්‍යවස්ථා වර්ගීකරණය අර්ථාන්විත – පරිපූර්ණ – විද්‍යාත්මක වර්ගීකරණයක් නොවන බවයි.*

## ඒකීය - සංධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

● <u>ඒකීය හා සංධීය ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ග කිරීමේ පදනම.</u>

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලතල බෙදා ඇති ආකාරය මත පදනම් වී ඒකීය හා සංධීය** ලෙස ව්‍යවස්ථා වර්ගීකරණය සිදු කරයි.

## ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

● <u>ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්දැයි හැඳින්වීම.</u>

**ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්දැයි නිර්වචනය කිරීම. මූලිකව ,** <u>රාජ්‍යයේ ස්වාධිපත්‍යය බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තනි මධ්‍යම ආණ්ඩුවක් වෙත ඒකරාශී කර ඇත්නම් එය ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ලෙස හඳුනාගත හැකිය.</u> **තවදුරටත් ,** <u>ව්‍යවස්ථාදායක , විධායක හා අධිකරණ යන ත්‍රිවිධ ආයතන ක්‍රියාත්මක කිරීම සම්බන්ධ බලතල තනි මධ්‍යම ආණ්ඩුවක් වෙතට පමණක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හිමිකර දී ඇත්නම් එය ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වේ.</u>

● <u>ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අදාළ දාර්ශනික නිර්වචන</u>

ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්දැයි හඳුනාගැනීම සඳහා භාවිතා කළ හැකි දාර්ශනික නිර්වචන

> **"එක් මධ්‍ය බල ආයතනයක් පමණක් නීති පැනවීම පිළිබඳව උත්තරීතර බලය ඉසිලීම ඒකීය ආණ්ඩුක්‍රමයක් වේ."**
>
> -ඩයිසි-
>
> **"සෑම ආකාරයකම අධිකාරී බලය එක් මධ්‍යයම ආයතනයක් තුල ඒකරාශී වී තිබේ නම් එය ඒකීය ආණ්ඩුක්‍රමයක් වේ."**
>
> -හර්මන් ෆයිනර්-

● <u>ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අදාළ නිදර්ශන</u>

ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අදාළව ඉදිරිපත් කළ හැකි ශක්තිවන්ත නිදර්ශන, **බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - ජපන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.**

● <u>ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ලක්ෂණ</u>

ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අදාළව ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිය. මෙහිදී මූලික ලක්ෂණ දෙකක් පමණක් විස්තර කිරීම.

**(i) තනි මධ්‍යම ආණ්ඩුවකට පමණක් බලතල හිමිකර දීම.**

ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අදාළ මූලික ලක්ෂණයක් වන්නේ ව්‍යවස්ථාදායක , විධායක හා අධිකරණ යන ත්‍රිවිධ ආයතන සම්බන්ධ බලතල තනි මධ්‍යම ආණ්ඩුවක් වෙතට ඒකරාශී කර තිබීමයි.

**(ii) පරිපාලනයේ පහසුව සඳහා පලාත් පාලන ආයතන පිහිටුවීම.**

ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අදාළ තවත් මූලික ලක්ෂණයක් වන්නේ පරිපාලනයේ පහසුව සඳහා ව්‍යවස්ථාදායකය තුළ සම්මත කරගත් සාමාන්‍ය නීතියක් මගින් පළාත් පාලන ආයතන පිහිටුවා තිබීමයි. එම පලාත් පාලන ආයතන වල බලතල සංශෝධනය කිරීමට , අහෝසි කිරීමට , නැවත පවරාගැනීමට මධ්‍යම ආණ්ඩුවට හැකිය. <u>ඒකීය ක්‍රමයක් තුළ ඇති පළාත් පාලන ආයතනයන්ට නිදර්ශන</u>

නිදර්ශන - **බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රමය** මගින් නිර්මාණය කර ඇති පලාත් පාලන ආයතනය (කෝරළ සභා - පේරු සභා - වසම් - කෝරළ දිස්ත්‍රික් සභා - කොරනල් සභා)

**1978 ශ්‍රී ලාංකීය ආණ්ඩුක්‍රමය** මගින් නිර්මාණය කර ඇති පලාත් පාලන ආයතන (නගර සභා - මහනගර සභා - ප්‍රාදේශීය සභා )

**ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව** මගින් නිර්මාණය කර ඇති පලාත් පාලන ආයතන (දෙපාර්තමේන්තු - කැන්ටන - කොමියුන )

● <u>ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක හඳුනාගත හැකි වාසි හා අවාසි</u>.

ඒකීය ආණ්ඩුක්‍ර ව්‍යවස්ථා සම්බන්ධ කතිකාව තුළ දී ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක වාසි (වැදගත්කම්) - අවාසි (දුර්වලකම්) සම්බන්ධයෙන් අවධානය කළ යුතු ය.

| වාසි (වැදගත්කම) | අවාසි (දුර්වලතා) |
|---|---|
| o කුඩා රාජ්‍යයන් කාර්යක්ෂමව පාලනය කිරීමට හැකිවීම.<br>o බලය කාර්යක්ෂම ලෙස ක්‍රියාවට නැගීමට හැකිවීම<br>o බලය ක්‍රියාවට නංවන්නේ කුමන ආයතනය විසින් දැයි පැහැදිලිව හඳුනාගැනීමට හැකිවීම.<br>o අර්බුද අවස්ථාවන්ට වඩා හොඳින් මුහුණදිය හැකිවීම.<br>o ප්‍රාදේශීය අවශ්‍යතා සහ ජාතික අවශ්‍යතා අතර ගැටුම් ඇතිනොවීම.<br>o පරිපාලන සහ අධිකරණ අංශයන්හි ඒකීයත්වය රැකගැනීමට හැකිවීම. | o විශාල භූමියක් කාර්යක්ෂමව හා විධිමත්ව පාලනය කිරීමට නොහැකිවීම.<br>o විශමතා සහිත රාජ්‍යයක් පාලනය සඳහා මෙම ක්‍රමය නොගැලපීම.<br>o විජාතීය බහුසංස්කෘතික හැඩතල සහිත සමාජයකට මෙය නොගැලපීම<br>o විවිධ ජන කණ්ඩායම් වල අවශ්‍යතා ඉටු නොවීමට ඇති අවකාශය |

## සංඝීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

● <u>සංඝීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්දැයි හැඳින්වීම.</u>

**සංඝීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්දැයි නිර්වචනය කිරීම. මූලිකව ,** <u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මධ්‍ය හා ප්‍රාන්ත ආණ්ඩුවලට බලතල බෙදා හැර ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සංඝීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ලෙස හඳුනාගත හැකිය.</u> **තවදුරටත් ,** <u>රාජ්‍යයේ ස්වාධිපත්‍යය බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මධ්‍යය ආණ්ඩුවලටත් ප්‍රාන්ත ආණ්ඩුවටත් පවරා ඇත්නම් එය සංඝීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වේ.</u>

● <u>සංඝීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අදාළ දාර්ශනික නිර්වචන</u>

සංඝීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්දැයි හඳුනාගැනීමට භාවිතා කළ හැකි දාර්ශනික නිර්වචන

> **"සංඝීය ආණ්ඩුක්‍රමයක් යනු විවිධත්වය තුළින් ඒකීයත්වය ළඟා කරගැනීමට මග සලසන ආණ්ඩුක්‍රමයක් වේ."**
>
> -ඩයිසි-

● <u>සංඝීය ආණ්ඩු ව්‍යවස්ථාවන්ට අදාළ නිදර්ශන</u>

සංඝීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අදාළව ඉදිරිපත් කළ හැකි ශක්තිවන්ත නිදර්ශන , **ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - ස්විස්ටර්ලන්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - කැනඩානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.**

● <u>සංඝීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ලක්ෂණ</u>

සංඝීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අදාළව ලක්ෂණ කිහිපයක් විග්‍රහ කිරීම.

(i) **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මධ්‍යය හා ප්‍රාන්ත ආණ්ඩුවලට බලය බෙදීම.**

සංඝීය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවකට අදාළ මූලික ලක්ෂණයක් වන්නේ මධ්‍ය හා ප්‍රාන්ත ආණ්ඩු වලට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලතල බෙදීමයි. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් බලතල විමධ්‍යගත කර තිබීම ලක්ෂණයකි.

(ii) **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය බෙදාහරින්නේ එකිනෙකට වෙනස් ක්‍රම මගිනි.**

බලතල විමධ්‍යගත කිරීමේදී භාවිත කරනු ලබන විධි විධාන සංඝීය ක්‍රමයෙන් සංඝීය ක්‍රමයට ගතික වේ. ඊට අදාළව **ඉදිරිපත් කල හැකි විධිවිධාන,**

- **ජාතික වශයෙන් වැදගත් අංශ මධ්‍යම ආණ්ඩුවට ද ප්‍රාදේශීය අංශ ප්‍රාන්ත ආණ්ඩුවලට ද පැවරීම.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලතල බෙදාහැරීමේදී බොහෝ විට විට **ආරක්ෂක** - **විදේශ කටයුතු** - මුදල් වැනි ජාතික වශයෙන් වැදගත්කමක් ඇති අංශ වල බලතල මධ්‍ය ආණ්ඩුවට හිමිකර දෙන අතර එම අංශ සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ කටයුතු කිරීමට බලය මධ්‍යම ආණ්ඩුව සතු වේ. බොහෝ විට **කෘෂිකර්ම** - **සෞඛ්‍යය** - **ප්‍රවාහන** - **අධ්‍යාපන** වැනි ප්‍රාදේශීය අංශ වල බලතල ප්‍රාන්ත ආණ්ඩුවලට ලබාදීම. එම අංශ සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ කටයුතු කිරීමට බලතල ප්‍රාන්ත ආණ්ඩු වලට පවරා දෙයි.

- **ඇතැම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් මගින් මධ්‍යම ආණ්ඩුව බලවත් කොට නිර්මාණය කරන අතර ඇතැම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් මගින් ප්‍රාන්ත ආණ්ඩු බලවත් කොට නිර්මාණය කිරීම.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලතල බෙදාහරින විට මධ්‍යම ආණ්ඩුව බලවත් කොට නිර්මාණය කළ හැකිය. කැනඩානු ආණ්ඩුක්‍රමය මීට අදාළ නිදර්ශනයකි. ඇතැම්විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රාන්ත ආණ්ඩු බලවත් කොට නිර්මාණය කළ හැකිය. ඇමරිකානු ආණ්ඩුක්‍රමය මීට අදාළ නිදර්ශනයකි.

- **ආණ්ඩුක්‍රමය ව්‍යවස්ථාව මගින් බලතල බෙදාහැරීම සඳහා භාවිතා කරන ක්‍රම තුනකි.**

ඇමරිකානු ක්‍රමය - **මධ්‍යම ආණ්ඩුව සතු බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා නොමැති ශේෂ බලතල සියල්ල ප්‍රාන්ත ආණ්ඩුවලට පැවරීම.** මෙහි අරමුණ වන්නේ ශක්තිමත් ප්‍රාන්ත ආණ්ඩු නිර්මාණය කිරීමයි. ඇමරිකාව-ස්විස්ටර්ලන්තය නිදසුන් වේ.

කැනේඩියානු ක්‍රමය - **ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල දක්වා දක්වා නොමැති ශේෂ බලතල සියල්ල මධ්‍යම ආණ්ඩුවට පැවරීම.** මෙහි අරමුණ වන්නේ ශක්තිමත් මධ්‍ය ආණ්ඩුවක් නිර්මාණය කිරීමයි. නිදසුන් ලෙස කැනඩාව දැක්විය හැකිය.

ඉන්දියානු ක්‍රමය - **මධ්‍යය ආණ්ඩුව සතු බලතල ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල මෙම ආණ්ඩු දෙකටම භුක්තිවිඳිය හැකි සමගාමී බලතල වෙන වෙනම දැක්වීම** මෙහිදී වුව ද ප්‍රායෝගික තලය තුළදී නිර්මාණය වන්නේ ශක්තිමත් මධ්‍යය ආණ්ඩුවක් ය. ඊට හේතු වන්නේ සමගාමී ලැයිස්තුව සම්බන්ධ යම් අර්බුධයකදී මධ්‍යය ආණ්ඩුව බලවත් වීමයි. නිදසුන් ලෙස ඉන්දියාව දැක්විය හැකිය.

● <u>සංඝීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක හඳුනාගත හැකි වාසි හා අවාසි</u>.

සංඝීය ආණ්ඩුක්‍ර ව්‍යවස්ථා සම්බන්ධ කතිකාව තුළ දී සංඝීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක වාසි (වැදගත්කම්) - අවාසි (දුර්වලතා) සම්බන්ධයෙන් අවධානය කළ යුතු ය.

| වාසි (වැදගත්කම) | අවාසි (දුර්වලතා) |
| --- | --- |
| ○ විශාල රාජ්‍යයන් පාලනයට පහසුවීම.<br>○ විවිධත්වය තුළින් ඒකීයත්වය ළඟ කර ගත හැකිවීම.<br>○ මධ්‍යම ආණ්ඩුවේ අත්තනෝමතික පාලනය මර්ධනය වීම.<br>○ කුඩා දුබල රාජ්‍යයන්ට ස්වකීය පැවැත්ම සහතික කරගැනීමට හැකිවීම.<br>○ විශමතා සහිත රාජයයන් එම විශමතාවයන්ට ගැළපෙන සේ පාලනය කළ හැකිවීම.<br>○ රාජ්‍යයන් කිහිපයකට එකම දේශපාලන අරමුණක් ඇති වූ විට එය ළඟ කර ගැනීමට හැකිවීම.<br>○ බහුවිධතාවය සහිත ඒකක එකට එකතු කොට එක් මාධ්‍යයක් බවට පත්කිරීමට හැකියාව. | ○ රටේ ඒකාබද්ධතාවයට අහිතකරවීම.<br>○ පරිපාලන ඒකීයත්වය ගොඩනගා ගැනීමට අපහසුවීම.<br>○ වියදම් අධික ක්‍රමයක්වීම.<br>○ ද්විත්ව පාලනයන් හේතු කොටගෙන ගැටුම් ඇතිවිය හැකිවීම.<br>○ සාර්ථක විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීමට අපහසුවීම.<br>○ විවිධත්වය එලෙසම පත්වාගෙන යාම නිසා වාර්ගික ප්‍රශ්න ඉස්මතුවීම.<br>○ කොටස් රාජ්‍යයන්ට වෙන්ව යැමේ අවකාශය පවතින නිසා දේශපාලන අස්ථාවර භාවයක් ඇතිවිය හැකිවීම. |

● <u>ඒකීය හා සංඝීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්බන්ධයෙන් එළඹිය හැකි නිගමනය</u>

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය බෙදා හැර ඇති ආකාරය මත පදනම් වී සිදු කර ඇති ඒකීය – සංඝීය ව්‍යවස්ථා වර්ගීකරණය පරිපූර්ණ – අර්ථාන්විත – විද්‍යාත්මක වර්ගීකරණයක් ලෙස හඳුනාගත හැකිය. ඊට <u>හේතුවන්නේ නූතන ජාතික රාජ්‍යයන් තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පරිපූර්ණ වශයෙන් ඒකීය භාවයකින් හෝ පරිපූර්ණ වශයෙන් සංඝීය ස්වරූපයක් ගැනීමයි.</u> එම නිසා මෙම වර්ගීකරණය ලිඛිත – අලිඛිත , නම්‍ය – අනම්‍ය වර්ගීකරණයට සාපේක්ෂව පරිපූර්ණ – අර්ථාන්විත වර්ගීකරණයක් ලෙස හඳුනාගත හැකිය.*



## විකාශිත - පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

● <u>විකාශිත හා පනවන ලද ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ග කිරීමේ පදනම</u>

විකාශිත හා පනවන ලද වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් නීතියෙන් බිහිවූ හා ව්‍යවහාරයෙන් බිහි වූ ව්‍යවස්ථා වර්ගීකරණය සිදුකොට ඇත්තේ **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය වූ ආකාරය මතය.**

## විකාශිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

● <u>විකාශිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථායක් යනු කුමක්දැයි හැඳින්වීම.</u>

ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලයක් විසින් නිශ්චිත කාලසීමාවක් තුළ සම්පාදනය නොකළ ව්‍යවහාරයෙන් බිහිවූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විකාශිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ලෙස නිර්වචනය කළ හැකිය.

● <u>විකාශිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ලක්ෂණ</u>

විකාශිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අදාළව හඳුනාගත හැකි ප්‍රධානම ලක්ෂණ කිහිපයකි. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්ප්‍රදායන් මත ක්‍රියාත්මක වීම. - අලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම. - ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් විසින් ව්‍යවස්ථාව නිර්මාණය නොකිරීම.**

● <u>විකාශිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අදාළ නිදර්ශන</u>

විකාශිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අදාළව සැපයිය හැකි ශක්තිවන්ත නිදර්ශනයක් වන්නේ **බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි.** එය දීර්ඝ කාලයක් තිස්සේ විකාශනය වූ ලොව ඇති පැරණිම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වේ.

● විකාශිත <u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක හඳුනාගත හැකි වාසි හා අවාසි</u>.

විකාශිත ආණ්ඩුක්‍ර ව්‍යවස්ථා සම්බන්ධ කතිකාව තුළ දී විකාශිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක වාසි (වැදගත්කම්) - අවාසි (දුර්වලතා) සම්බන්ධයෙන් අවධානය කළ යුතු ය.

| වාසි (වැදගත්කම) | අවාසි (දුර්වලතා) |
|---|---|
| ○ එම රාජ්‍යයට ආවේණික තත්ත්වයන් මත ව්‍යවස්ථාව උත්පාද වීම.<br>○ ව්‍යවස්ථාව උත්තරාරෝපිත එකක් නොවී ක්‍රමික විකාශනයකින් බිහිවීම.<br>○ විකාශිත ව්‍යවස්ථා අලිඛිත නිසා අලිඛිත ව්‍යවස්ථාවක වාසි ද මීට අදාළ වේ.<br>○ විකාශිත ව්‍යවස්ථා නම්‍ය නිසා නම්‍ය ව්‍යවස්ථාවක වාසි ද මීට අදාළ වේ. | ○ නෛතික පදනමින් ඔබ්බට ගිය සම්ප්‍රදායන්- සිරිත් විරිත්-චාරිත්‍ර වාරිත්‍ර වැනි ආචාර ධර්මීය පදනමක් මත ක්‍රියාත්මක වීම.<br>○ විකාශිත ව්‍යවස්ථා අලිඛිත වේ. එම නිසා අලිඛිත ව්‍යවස්ථාවක අවාසි මීට අදාළ වේ.<br>○ විකාශිත ව්‍යවස්ථා නම්‍ය වේ. එම නිසා නම්‍ය ව්‍යවස්ථාවක අවාසි මීට අදාළ වේ. |

## පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

● <u>පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථායක් යනු කුමක්දැයි හැඳින්වීම.</u>

ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලයක් විසින් නිශ්චිත කාලසීමක් තුළදී නිර්මාණය කරන ලද ව්‍යවස්ථා පනවන ලද හෙවත් නීතියෙන් බිහිවූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ලෙස නිර්වචනය කළ හැකිය.

● <u>පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථායක ලක්‍ෂණ</u>

පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අදාළව හඳුනාගත හැකි ප්‍රධානම ලක්‍ෂණ කිහිපයකි. **ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වීම - නෛතික මට්ටම තුළ අනම්‍ය ස්වභාවක් ගැනීම. - ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් විසින් සම්පාදනය කිරීම.**

● <u>පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අදාළ නිදර්ශන</u>

පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අදාළව සැපයිය හැකි ශක්තිවන්ත නිදර්ශන, **ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

● <u>පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක හඳුනාගත හැකි වාසි හා අවාසි</u>.

පනවන ලද ව්‍යවස්ථා සම්බන්ධ කතිකාව තුළ දී පනවන ලද ව්‍යවස්ථාවක වාසි (වැදගත්කම්) - අවාසි (දුර්වලතා) සම්බන්ධයෙන් අවධානය කළ යුතු ය.

| වාසි (වැදගත්කම) | අවාසි (දුර්වලතා) |
|---|---|
| ○ අවශ්‍යය ආකාරයට නිර්මාණය කිරීමට හැකිවීම.<br><br>○ පාලනය කරන ලද තත්ත්වයන් යටතේ ව්‍යවස්ථාව සම්පාදනය කිරීමට හැකිවීම.<br><br>○ පනවන ලද ව්‍යවස්ථා ලිඛිත වේ. එම නිසා ලිඛිත ව්‍යවස්ථාවක වාසි මීට අදාළ වේ.<br><br>○ පනවන ලද ව්‍යවස්ථා අනම්‍යය වේ. එම නිසා අනම්‍ය ව්‍යවස්ථාව ක වාසි මීට අදාළ වේ. | ○ පනවන ලද ව්‍යවස්ථා ලිඛිත වේ. එම නිසා ලිඛිත ව්‍යවස්ථාවක අවාසි මීට අදාළ වේ.<br><br>○ පනවන ලද ව්‍යවස්ථා අනම්‍ය වේ. එම නිසා අනම්‍ය ව්‍යවස්ථාවක අවාසි මීට අදාළ වේ.<br><br>○ පනවන ලද ව්‍යවස්ථා උත්තරාරෝපිත හැඩයක් දරණ නිසා ඇතැම් විට රාජ්‍යය තුළ පවතින සංස්කෘතික තත්ත්වයන් වලට එය නොගැලපිය හැකිය. |

● <u>විකාශිත හා පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්බන්ධයෙන් එළඹිය හැකි නිගමනය</u>

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය වී ඇති ආකාරය මත පදනම් වී සිදු කර ඇති මෙම වර්ගීකරණය පරිපූර්ණ වර්ගීකරණයක් නොවේ. <u>ඊට හේතුව විකාශිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුළ නීතයෙන් පැනවූ කරුණු ද පනවන ලද ව්‍යවස්ථා තුළ සම්ප්‍රදාය මත බිහිවූ විකාශිත කරුණු ද අන්තර්ගත වීමයි.</u>*

# සංධීය රාජ්‍යයක් නිර්මාණය වීමට බලපාන මූලික කරුණු

## සංඝීය රාජ්‍යයක් නිර්මාණය වීමට බලපාන මූලික කරුණු

ප්‍රවේශය,

**● සංඝීය රාජ්‍යයක් යනු කුමක්දැයි හැඳින්වීම.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මධ්‍යය හා ප්‍රාන්ත ආණ්ඩු වලට බලතල බෙදාහැර ඇති රාජ්‍යයන් සංඝීය රාජ්‍යයක් ලෙස හැඳින්විය හැකිය. තවදුරටත්, රාජ්‍යයයේ ස්වාධිපත්‍යය බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මධ්‍යය හා ප්‍රාන්ත ආණ්ඩුවලට හිමිකර දී ඇති රාජ්‍යයක් සංඝීය රාජ්‍යයක් ලෙස නිර්වචනය කළ හැකිය.

**● සංඝීය රාජ්‍යයන් සම්බන්ධයෙන් පළවී ඇති දාර්ශනික නිර්වචන**

"රාජ්‍යයන් සමූහයකින් සැදුණු අභිනව ආණ්ඩුවක් සංඝීය රාජ්‍යයකි."
-හැමිල්ටන්-

"රාජ්‍යයන්ට අයිතිවාසිකම් ආරක්ෂාකරගැනීම සඳහා පිහිටුවන ජාතික එක්සත් මණ්ඩලය " -ඩයිසි-

**● සංඝීය රාජ්‍යයන්ට අදාළ නිදර්ශන**

ඇමරිකාව - ඉන්දියාව - ඕස්ට්‍රේලියාව - ස්විස්ටර්ලන්තය - කැනඩාව

**● සංඝීය රාජ්‍යයක හඳුනාගත හැකි ලක්ෂණ**

(i) මධ්‍ය ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර ස්වාධිපත්‍යය බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බෙදා දැක්වීම.

(ii) සියලුම සංඝීය රාජ්‍යයන් සමානව සැලකීම.

(iii) නිශ්චිත ලෙස බලතල බෙදා දැක්වීම.

(iv) නිදහස් හා ස්වාධීන අධිකරණයක් පැවතීම.

(v) මධ්‍යම ආණ්ඩුවෙහි ව්‍යවස්ථාදායකය ද්වීමාණ්ඩලික වීම.

(vi) බොහෝ විට ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම හා ව්‍යවස්ථාවේ උත්තරීතරික භාවය.

(vii) අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම.

(viii) බොහෝ විට ද්විත්ව පුරවැසිභාවය පුරවැසියන්ට හිමිවේ.

## ● සංධීය රාජ්‍යයක් බිහිවීමට බලපාන මූලිකව කරුණු

(i) භූගෝලීය සාධකය
(ii) සංස්කෘතික සාධකය හෙවත් බහුවිධ සමාජයක් පැවතීම.
(iii) ආර්ථික සාධකය
(iv) ආරක්ෂක සාධකය
(v) දේශපාලන සාධකය

සංධීය රාජ්‍යයක් නිර්මාණයවීම සඳහා මෙම සාධක අතරින් එකක් හෝ කිහිපයක් එකවිට බලපෑ හැකිය. එසේම මෙම සාධක අතර අන්තර් සම්බන්ධතාවයක් ද පවතී.

| (i) | භූගෝලීය සාධකය |
|---|---|

භූගෝලීය සාධකය සංධීය රාජ්‍යයක් නිර්මාණයවීම සඳහා බලපාන මූලික සාධකයකි. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් රාජ්‍යයක් සතු භූමිය සංධීය රාජ්‍යය නිර්මාණයවීමට බලපායි. භූගෝලීය සාධකය ආකාර දෙකකට ඛණ්ඩනය කළ හැකිය.

**භූමියේ ප්‍රමාණය**
**භූමියේ විෂමතාවය**

**භූමියේ ප්‍රමාණය** , යම් රාජ්‍යයක් සතුව ඉතා විශාල භූමියක් පවතීනම් එවැනි තත්ත්වයක් සංධීය රාජ්‍යයක් බිහිවීමට බලපායි. ඊට හේතු හේතු වන්නේ ඉතා විශාල භූමියක් තනි මධ්‍යම ආණ්ඩුවකට පාලනය කිරීමට නොහැකි වීමයි.

**භූමියේ විෂමතාවය** , යම් රාජ්‍යයක් සතුව පවතින භූමිය විෂමතා සහිත එකක් නම් එවැනි තත්ත්වයක් තුළ ද සාර්ථක පාලන ක්‍රමයක් ඇති කිරීම සඳහා සංධීය රාජ්‍යයක් නිර්මාණය විය හැකිය. භූගෝලීය සාධකය මත බිහිවූ සංධීය රාජ්‍යයන්ට නිදර්ශන ලෙස ඇමරිකාව - ස්විස්ටර්ලන්තය ආදිය දැක්විය හැකිය.

<u>ස්විස්ටර්ලන්තය</u> අතිවිශාල කඳු වලින් වට වූ සම බිම් සහිත රාජ්‍යයකි. එම සම බිම් තුළ ස්විස්ටර්ලන්ත ජනයා ජීවත්වෙයි. ඒවා කැන්ටනයක් ලෙස හඳුන්වයි. ස්විස්ටර්ලන්තය සංධීය රාජ්‍යයක් ලෙස නිර්මාණය වන්නේ මෙලෙස භූමියේ පැවති විෂමතාවය නිසාය.

<u>ඇමරිකාව</u> ද භූගෝලීය සාධකය මත නිර්මාණය වූ සංධීය ක්‍රමයකට නිදසුනකි. ඇමරිකාව භූමියේ ප්‍රමාණය අතින් අති විශාල රාජ්‍යයකි. ලෝක භූමියෙන් 1/19 ක් ඇමරිකාවට අදාළ වේ. එම නිසා එවැනි භූමියක් සාර්ථකව පාලනය කිරීමට ඇමරිකානු සංධීය ක්‍රමය නිර්මාණය විය.

භූගෝලීය සාධකය මත සංධීය රාජ්‍යයක් නිර්මාණයවීම සඳහා **සංධීය ඒකක ලෙස එකතුවීමට බලාපොරොත්තු වන රාජ්‍යයන් හි භූමිය සමීපව පිහිටා තිබීම ඉතා වැදගත් වෙයි. එකිනෙකට දුරස් භූමි ප්‍රදේශ එක් කොට සංධීය ක්‍රමයක් නිර්මාණය කිරීම ඉතා අපහසුය. නිදසුනක් ලෙස බ්‍රිතාන්‍යය යටත්විජිත ඒකරාශී කොට නිර්මාණය කිරීමට උත්සාහ ගත් සංධීය ක්‍රමය අසාර්ථක වීම පෙන්වා දිය හැකිය.**

| (ii) | **සංස්කෘතික සාධකය හෙවත් බහුවිධ සමාජයක් පැවතීම.** |
|---|---|

සංස්කෘතික සාධකය ද සංධීය රාජ්‍යයක් නිර්මාණයවීම සඳහා බලපානු ලබයි. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් **බහුවිධ විජාතීය සමාජ ක්‍රමයන්** සංධීය රාජ්‍යයන් නිර්මාණයවීම කෙරෙහි සෘජුව හේතු වෙයි. යම් භූමියක විවිධ භාෂා , ආගම් , වාර්ගික පදනමක් සහිත බහු සංස්කෘතික ජන කණ්ඩායම් වාසය කරන්නේ නම් එවැනි තත්ත්වයක් තුළ සියලු සංස්කෘතීන්ගේ අවශ්‍යතාවයන් තෘප්තිමත් කිරීම සඳහා සංධීය ක්‍රමයකට එළඹිය හැකිය.

සංස්කෘතික සාධකය මත බිහිවූ සංධීය රාජ්‍යයන්ට <u>නිදර්ශන</u> ලෙස **සෝවියට් සංගමය - ඉන්දියාව** දැක්විය හැකිය.

<u>සෝවියට් සංගමය</u> , 1917 බොල්ෂවික් විප්ලවයට පූර්ව අවධිය තුළ **සාර් රජු විසින් රුසියානු අධිරාජ්‍යය නිර්මාණය කොට තිබුණි.** එහිදී රුසියාව අවට පැවති කුඩා රාජ්‍යයන් බලහත්කාරයෙන් රුසියාවට ඈඳා ගනිමින් මෙම ඒකාධිපති සාර් රජුගේ මහාධිරාජ්‍යය ගොඩනගා තිබුණි. සාර් ඒකාධිපති අධිරාජ්‍යය බිඳ දැමූ ලෙනින් ප්‍රමුඛ නායකයින් එම අවශේෂ රාජ්‍යයන්ට **ස්වයං තීරක අයිතිය** ප්‍රදානය කරමින් සෝවියට් සමූහාණ්ඩුව නිර්මාණය කළේය.

<u>ඉන්දියාව</u> , සංස්කෘතික සාධකය මත නිර්මාණය වූ සංධීය රාජ්‍යයකි. ඉන්දියානු සමාජය දෘඩ බහුවිධතාවය සහිත සමාජයකි. **නිදසුනක් ලෙස ඉන්දියාව තුළ භාෂා හා උප භාෂාවන් 1652 කට ආසන්න සංඛ්‍යාවක් පවතී. ලෝකය තුළ පවතින සෑම ආගමක්ම ඉන්දියාව තුළ පවතී.** මෙවැනි සංස්කෘතිකමය විශේෂතාවයක් විජාතීය භාවයක් පැවතීම නිසා ඉන්දියාව සංධීය රාජ්‍යයක් ලෙස නිර්මාණය විය.

| (iii) | **ආර්ථික සාධකය** |
|---|---|

ආර්ථික සාධකය ද සංධීය රාජ්‍යයක් නිර්මාණයවීම සඳහා බලපායි. එකිනෙකට වෙනස් ආර්ථික හැකියාවන්ගෙන් යුක්ත රාජ්‍යයන් එකිනෙකට එකතුවී සංධීය රාජ්‍යයන් නිර්මාණය කර ගනී.

<u>ඇමරිකානු</u> සංධීය ක්‍රමය ආර්ථික සාධකය මත නිර්මාණය වූ සංධීය ක්‍රමයක් ලෙස හඳුනාගත හැකිය. ඇමරිකානුවන් මුල් අවස්ථාවේ නිර්මාණය කරගනු ලබන්නේ සංයුක්ත ආණ්ඩුක්‍රමයකි. එය එතරම් ශක්තිමත් ක්‍රමයක් නොවේ. පසුව 1789 දී ඇමරිකාව සංධීය රාජ්‍යයක් බවට පත්වෙයි.

| (iv) | **ආරක්ෂක සාධකය** |
|---|---|

ආරක්ෂක සාධකය ද සංධීය රාජ්‍යයන් නිර්මාණය වීම උදෙසා බලපායි. විශේෂයෙන් විශාල රාජ්‍යයන්ගෙන් එල්ලවිය හැකි ආක්‍රමණ - තර්ජන - යුධමය තත්ත්වයන්ගෙන් ආරක්ෂාවීම සඳහා භූගෝලීයව සමීපව පිහිටා ඇති කුඩා රාජ්‍යයන් එකට එකතු වී සංධීය ක්‍රමයක් ගොඩනගා ගත හැකිය.

ආරක්ෂක සාධකය මත නිර්මාණය වූ සංධීය රාජයයකට ශක්තිමත් නිදර්ශනයක් ලෙස ඇමරිකානු සංධීය ක්‍රමය දැක්විය හැකිය. බ්‍රිතාන්‍යය අධිරාජ්‍යවාදීන්ගෙන් නිදහස ලබාගත් ඇමරිකානුවන් නැවතත් එල්ලවිය හැකි ආක්‍රමණයකින් වැලකීම සඳහා ස්වකීය ජනපද වල ආරක්ෂාව තහවුරු කරගැනීම සඳහා ප්‍රධාන ජනපද 13 ක් එකට එකතුවී ඇමරිකානු සංධීය ක්‍රමය නිර්මාණය කර ගනී.

ඕස්ට්‍රේලියානු සංධීය ක්‍රමය ද ආරක්ෂ සාධකය මත නිර්මාණය වූ සංධීය ක්‍රමයකට නිදසුනකි. දෙවන ලෝක යුධ සමය තුළ ශාන්තිකර සාගරයේ ජපන් නාවුක බලය තහවුරුවීමත් සමඟ ජපානයෙන් එල්ලවිය හැකි ආක්‍රමණයකින් මිදීම උදෙසා ඕස්ට්‍රේලියාව සංධීය රාජ්‍යයක් බවට පත්වේ.

| (v) | දේශපාලන සාධකය |
|---|---|

දේශපාලන සාධකය ද සංධීය රාජ්‍යයක් නිර්මාණවීම උදෙසා බලපායි. රාජ්‍යයන් කිහිපයකට එකම දේශපාලන අරමුණක් සාක්ෂාත් කර ගැනීමට ඇති විට එම දේශපාලන අරමුණු දිනාගැනීම සඳහා එම රාජ්‍යයන් සංධීය ක්‍රමයක් ගොඩනගා ගනී.

සෝවියට් සංගමය දේශපාලන සාධකය මත නිර්මාණය වූ සංධීය ක්‍රමයකට නිදසුනකි. 1917 ලෙනින් ප්‍රමුඛ නියකයින් බොල්ෂවික් විප්ලවය මතින් සාර් රාජාණ්ඩුව බිඳ දමා සාර් අධිරාජ්‍යය යටතේ පැවති රාජ්‍යයන්ට ස්වාධීන පැවැත්මකට අවකාශය ලබාදුනි. නමුත් එම රාජ්‍යයන් ලෙනින් ප්‍රමුඛ නායකයින්ගේ දේශපාලන අරමුණ වූ විද්‍යාත්ම කොමියුනිස්ට් සමාජය උදාකරගැනීම සඳහා නැවත සංධීය ක්‍රමයක් යටතේ සංවිධාන ගත විය.

# ඒකීය රාජ්‍යයක් සංධීය රාජ්‍යයකින් වෙනස් වන ලක්ෂණ

# ඒකීය රාජ්‍යයක් සංධීය රාජ්‍යයකින් වෙනස් වන ලක්‍ෂණ

ප්‍රවේශය,

● <u>ඒකීය රාජ්‍යය හා සංධීය රාජ්‍යය හැඳින්වීම.</u>

ඒකීය රාජ්‍යයක් යනු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මධ්‍යය ආණ්ඩුවට පමණක් බලතල ලබාදී ඇති ආණ්ඩුක්‍රමයක් සහිත රාජ්‍යයකි. සංධීය රාජ්‍යයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මධ්‍යය හා ප්‍රාන්ත ආණ්ඩුවලට බලය ලබාදී ඇති ආණ්ඩුක්‍රමයක් සහිත රාජ්‍යයකි.

● <u>ඒකීය හා සංධීය රාජ්‍යය සම්බන්ධයෙන් පළවී ඇති දාර්ශනික නිර්වචන</u>

**"ඒකීය රාජ්‍යයක් යනු රාජ්‍ය සතු උත්තරීතර බලය එක් කේන්ද්‍රීය අධිකාරියක් මගින් මෙහෙයවනු ලබන තත්ත්වයකි. "**

-ඩයිසි-

**"රාජ්‍යයන් සමූහයකින් සැදුණු අභිනව ආණ්ඩුව සංධීය රාජ්‍යයකි."**

-හැමිල්ටන්-

● <u>ඒකීය හා සංධීය රාජ්‍යයන්ට අදාළ නිදර්ශන</u>

ඒකීය රාජ්‍යයන්ට අදාළ නිදර්ශන ලෙස බ්‍රිතාන්‍යය - ලංකාව - ප්‍රංශය ආදී රාජ්‍යයන් දැක්විය හැකිය. සංධීය රාජ්‍යයන්ට අදාළ නිදර්ශන ලෙස ඇමරිකාව - ඉන්දියාව -කැනඩාව - ඕස්ට්‍රේලියාව ආදී රාජ්‍යයන් දැක්විය හැකිය.

■ <u>ඒකීය රාජ්‍යයක් සංධීය රාජ්‍යයකින් වෙනස් වන ලක්‍ෂණ</u>

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය බෙදා හැර ඇති ආකාරය මත.
2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ලිඛිත හා නිර්ලිඛිත භාවය මත.
3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නම්‍ය හා අනම්‍ය භාවය මත.
4. අධිකරණය බලවත්වීම හා නොවීම මත.
5. ව්‍යවස්ථාදායකය ඒකමාණ්ඩලික හා ද්විමාණ්ඩලික වීම මත.

● <u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය බෙදා හැර ඇති ආකාරය මත.</u>

කරුණ

ඒකීය හා සංධීය රාජ්‍යයන් අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය බෙදා හැර ඇති ආකාරය මත වෙනසක් පවතී. **ඒකීය රාජයයන් තුළ රාජ්‍යය සතු ස්වාධිපත්‍යය බලය එක් මධ්‍යය ආණ්ඩුවකට පවරා ඇති අතර සංධීය රාජ්‍යයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්වාධිපත්‍යය බලය මධ්‍යය හා ප්‍රාන්ත ආණ්ඩු වලට පවරයි.**

විස්තරය <u>ඒකීය රාජ්‍යයන් තුළ</u> ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මගින් බලතල එක් මධ්‍යම ආණ්ඩුවකට පමණක් හිමිකරදීම ලක්ෂණයකි. මධ්‍යම ආණ්ඩුව විසින් ව්‍යවස්ථාදායක , විධායක හා අධිකරණ කාර්යයන් මෙහෙයවයි. නමුත් පරිපාලනයේ පහසුව සඳහා ව්‍යවස්ථාදායකය තුළ ඇති කර ගත් පනතක් මගින් පළාත් පාලන ආයතන පිහිටුවා තිබෙයි.

ලංකාව තුළ - නගර සභා - මහනගර සභා - ප්‍රාදේශීය සභා
බ්‍රිතාන්‍යය තුළ - පේරු සභා - කෝරල සභා - කොරනල් සභා - වසම්

<u>සංධීය රාජ්‍යයන්</u> තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මධ්‍යය හා ප්‍රාන්ත යන ආණ්ඩු වර්ග දෙකටම බලතල පවරා ඇත. එම නිසා ව්‍යවස්ථාදායක විධායක හා අධිකරණ කාර්යයන් මධ්‍යය ආණ්ඩුව විසින් හා ප්‍රාන්ත ආණ්ඩුව විසින් වෙන වෙනම සිදු කිරීම ලක්ෂණයකි. මෙහිදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ජාතික වශයෙන් වැදගත් මූල්‍ය - ආරක්ෂක - විදේශ කටයුතු වැනි අංශ වල බලතල මධ්‍යය ආණ්ඩුවටත් ප්‍රාදේශීය අංශ වන කෘෂි කර්මය - ධීවර - අධ්‍යාපනය - සෞඛ්‍යය - තැපැල් ආදී බලතල ප්‍රාන්ත ආණ්ඩුවලටත් හිමිකර දෙයි.

ඉන්දියාව තුළ - ප්‍රාන්ත රාජ්‍යය 28 කි.
ඇමරිකාව තුළ - ප්‍රාන්ත රාජ්‍යය 50 කි.

## <u>● ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ලිඛිත හා නිර්ලිඛිත භාවය මත.</u>

කරුණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ලිඛිත හා අලිඛිත භාවය මත ඒකීය හා සංධීය රාජ්‍යය අතර වෙනසක් පවතී. **සංධීය රාජ්‍යයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලිඛිත විය යුතුය. නමුත් ඒකීය රාජ්‍යයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ලිඛිත භාවය හෝ නිර්ලිඛිත භාවය සංධීය රාජ්‍යයකට සාපේක්ෂව එතරම් ප්‍රශ්නයක් නොවේ.**

විස්තරය <u>සංධීය රාජ්‍යයක</u> මධ්‍යය හා ප්‍රාන්ත ආණ්ඩු වශයෙන් ආණ්ඩු වර්ග දෙකක් පවතින නිසා එම ආණ්ඩු සතු බලතල වෙන වෙනම ලේඛනගත කිරීම ඉතා වැදගත්වේ. එසේ නොවුනහොත් බලතල මත මධ්‍යය හා ප්‍රාන්ත ආණ්ඩු අතර ගැටුම් ඇතිවිය හැකිය. එම නිසා සංධීය රාජ්‍යයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නියත ලෙසම ලිඛිත ස්වභාවයක් ගනී. නිදර්ශන ලෙස **ඇමරිකානු ආණ්ඩු ක්‍රමය - ඉන්දියානු ආණ්ඩුක්‍රමය** දැක්විය හැකිය.

<u>ඒකීය රාජ්‍යයක</u> බලතල එක් මධ්‍යම ආණ්ඩුවකට පමණක් හිමි නිසා බලතල සම්බන්ධයෙන් ගැටුම් ඇති නොවේ. එම නිසා ඒකීය රාජ්‍යයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලිඛිත හෝ නිර් ලිඛිත වීම එතරම් ප්‍රශ්නයක් නොවේ.

නිදර්ශන - ඒකීය රාජ්‍යයක් වන බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්ලිඛිතය.
**(N.B. මීට අදාළ තත්වයන් සටහන් කරන්න.)**

ඒකීය රාජ්‍යයක් වන ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලිඛිතය.
**(N.B. මීට අදාළ තත්වයන් සටහන් කරන්න.)**

## ● <u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නම්‍ය හා අනම්‍ය භාවය මත.</u>

(**N.B.** නිර්දේශිත ආණ්ඩුක්‍රම වල ව්‍යවස්ථා සංශෝධන විධිවිධාන අධ්‍යයනය කරන්න.)

කරුණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නම්‍ය හා අනම්‍ය භාවය මත ඒකීය හා සංධීය රාජ්‍යයන් අතර වෙනසක් පවතී. **සංධීය රාජ්‍යයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනම්‍යය විය යුතුමය. නමුත් ඒකීය රාජ්‍යයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංධීය රාජ්‍යයකට සාපේක්ෂව නම්‍ය හෝ අනම්‍ය වීම එතරම් ප්‍රශ්නයක් නොවේ.**

විස්තරය <u>සංධීය රාජ්‍යයක</u> මධ්‍යය හා ප්‍රාන්ත ආණ්ඩුවලට බලතල බෙදාහැර ඇති නිසා එම බලතල වෙනස් නොවී පැවතීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය අපහසු පදනමක එනම් අනම්‍යය පදනමක රඳවා තිබිය යුතුය.

නිදර්ශන - ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි.
(**N.B.** මීට අදාළ තත්වයන් සටහන් කරන්න.)

ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි.
(**N.B.** මීට අදාළ තත්වයන් සටහන් කරන්න.)

<u>ඒකීය රාජ්‍යයක</u> ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලතල එක් මධ්‍යම ආණ්ඩුවකට හිමිකරදෙන නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නම්‍ය හෝ අනම්‍ය භාවය එතරම් ප්‍රශ්නයක් නොවේ.

නිදර්ශන - ඒකීය රාජ්‍යයක් වන බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම්‍ය එකකි.
(**N.B.** මීට අදාළ තත්වයන් සටහන් කරන්න.)

ඒකීය රාජ්‍යයක් වන ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනම්‍ය එකකි.
(**N.B.** මීට අදාළ තත්වයන් සටහන් කරන්න.)

## ● <u>අධිකරණය බලවත්වීම හා නොවීම මත.</u>

(**N.B.** නිර්දේශිත ආණ්ඩුක්‍රම වල ව්‍යවස්ථා සංශෝධන විධිවිධාන අධ්‍යයනය කරන්න.)

කරුණ අධිකරණය බලවත්වීම හා නොවීම මත ඒකීය හා සංධීය රාජ්‍යයන් අතර වෙනසක් පවතී. **සංධීය රාජ්‍යයන් වල අධිකරණය බලවත් විය යුතුමය. නමුත් ඒකීය රාජ්‍යයන් හි අධිකරණය බලවත්වීම හෝ නොවීම එතරම් ප්‍රශ්නයක් නොවේ.**

විස්තරය <u>සංධීය රාජ්‍යය</u> තුළ මධ්‍යය හා ප්‍රාන්ත ආණ්ඩු අතර ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් බලතල බෙදා හැර තිබේ. එම නිසා විශේෂයෙන් ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල ආරක්ෂාවීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා විය යුතුය. එම හැකියාව ඇත්තේ ශක්තිමත් අධිකරණයකට පමණි. එම නිසා සංධීය රාජ්‍යක ශ්‍රේෂ්ඨාධිකරණයට **අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම ලබාදෙමින් අධිකරණය බලවත් ලෙස නිර්මාණය කරයි. මෙම තත්ත්වය මත සංධීය රාජ්‍යයක බලවත් අධිකරණයක් පැවතීම ප්‍රධාන ලක්ෂණයකි.

නිදර්ශන - ඇමරිකානු ශ්‍රේෂ්ඨාධිකරණය
ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය } (**N.B.** මීට අදාළ තත්ත්වයන් සටහන් කරන්න.)

<u>ඒකීය රාජ්‍යයක</u> ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලතල එක් මධ්‍යම ආණ්ඩුවකට ලබාදී ඇති නිසා ප්‍රාදේශීය පාලන ඒකක වල බලතල ආරක්ෂා කිරීම සඳහා බලවත් අධිකරණයක් අවශ්‍යය නොවේ. එම නිසා ඒකීය රාජ්‍යයන් තුළ අධිකරණය බලවත් වීමට හෝ නොවීමට හැකිය.

නිදර්ශන - ඒකීය රාජ්‍යයක් වන බ්‍රිතාන්‍යය අධිකරණය බලවත් නැත.
ඒකීය රාජ්‍යයක් වන ලංකාවේ අධිකරණය බලවත් වේ.
(**N.B.** මීට අදාළ තත්ත්වයන් සටහන් කරන්න.)

- <u>ව්‍යවස්ථාදායකය ඒකමාණ්ඩලික හා ද්වීමාණ්ඩලික වීම මත.</u>

කරුණ

ව්‍යවස්ථාදායකයේ ඒකමාණ්ඩලික හා ද්වී මාණ්ඩලික භාවය මත ඒකීය හා සංධීය රාජ්‍යය අතර වෙනසක් පවතී. **සංධීය රාජ්‍යයක ව්‍යවස්ථාදායකය ද්වීමාණ්ඩලික විය යුතුමය. නමුත් ඒකීය රාජ්‍යයක ව්‍යවස්ථාදායකය ඒක මාණ්ඩලික හෝ ද්වීමාණ්ඩලික වීම ප්‍රශ්නයක් නැත.**

විස්තරය

<u>සංධීය රාජ්‍යයක</u> ව්‍යවස්ථාදායකය ද්වීමාණ්ඩලික විය යුතුය. ඒ ප්‍රාන්ත රාජ්‍යයන්ට මධ්‍යම ආණ්ඩුව තුළ නියෝජනයක් ලබාදීමට මෙම අවශ්‍යතාවය නිසා සංධීය රාජ්‍යයන් හි මධ්‍යය ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකයේ දෙවන මණ්ඩලයක් පවතී.

නිදර්ශන - ඇමරිකානු ව්‍යවස්ථාදායකයේ දෙවන මණ්ඩලය **සෙනෙට් සභාව** මෙය සංධීය අවශ්‍යතාවය මත නිර්මාණය කරයි. දෙවන සභාවකි.

ඉන්දියානු ව්‍යවස්ථාදායකයේ දෙවන මණ්ඩලය **රාජ්‍ය සභාව යි**

<u>ඒකීය රාජ්‍යයක</u> මධ්‍යම ආණ්ඩුව පමණක් ඇති නිසා ව්‍යවස්ථාදායකය ඒකමාණ්ඩලික හෝ ද්වී මාණ්ඩලික වීම ප්‍රශ්නයක් නැත. එම නිසා ඇතැම් ඒකීය රාජ්‍යය වල ව්‍යවස්ථාදායකය ද්වී මාණ්ඩලික ද ඇතැම් ඒකීය රාජයයන් වල ව්‍යවස්ථාදායකය ඒකමාණ්ඩලික ද වේ.

නිදර්ශන - ඒකීය රාජයයක් වන ලංකාවේ ව්‍යවස්ථාදායකය ඒකමාණ්ඩලික වේ.
(**N.B.** මීට අදාළ තත්ත්වයන් සටහන් කරන්න.)

ඒකීය රාජයයක් වන බ්‍රිතාන්‍යය ව්‍යවස්ථාදායකය ද්වීමාණ්ඩලික වේ.
(**N.B.** මීට අදාළ තත්ත්වයන් සටහන් කරන්න.)

# සාර්ථක සංධීය ක්‍රමයේ ඇති කිරීමට අවශ්‍යය සාධක

## සාර්ථක සංධීය ක්‍රමයක් ඇති කිරීමට අවශ්‍යය සාධක

ප්‍රවේශය - සංධීය ක්‍රමය හඳුන්වන්න.
(නිර්වචන - ලක්‍ෂණ - උදාහරණ) මේ සඳහා භාවිතා කරන්න.

කරුණු -
1. එක්වීමේ හා වෙන්වීමේ ද්විත්ව අවශ්‍යතා එකවිට ඇතිවීම.
2. අසල්වැසි ප්‍රදේශ ඒකාබද්ධවීම.
3. පොදු ජාතිකත්වයක් තිබීම.
4. ආර්ථිකය
5. ශක්තිමය නීතිමය අධිකාරියක් තිබීම.
6. කොටස් රාජ්‍යයන්ට සමානව සැලකීම.

- <u>එක්වීමේ හා වෙන්වීමේ ද්විත්ව අවශ්‍යතා එකවිට ඇතිවීම.</u>

සාර්ථක සංධීය ක්‍රමයක් නිර්මාණය වීම සඳහා එක්වීම හා වෙන්වීම පිළිබඳ ද්විත්ව අවශ්‍යතාවයන් එක විට ඇතිවිය යුතුය. **ආර්ථික - ආරක්‍ෂක - දේශපාලන සාධක මත එක්වීම ද සංස්කෘතික භූගෝලීය සාධක මත වෙන්වීමේ අවශ්‍යතාවය ද ඇතිවීම පෙන්වා දිය හැකිය.**

එක්වීම හෙවත් ඒකාබද්ධවීමේ අවශ්‍යතාවය පමණක් ඉතා දෘඩව ඇතිවිට ඇති වන්නේ ඒකීය ක්‍රමයක් යටතේ වඩා හොඳින් සංවිධානත වීමයි. වෙන්වීමේ අවශ්‍යතාවය ඉතා දෘඩවම ඇති විට සිදුවන්නේ වෙන්ව ස්වාධීන රාජ්‍යයන් ලෙස ස්ථාපනය වීමයි. එම නිසා මෙම එක්වීමේ හා වෙන්වීමේ අවශ්‍යතාවය එකවිට ඇතිවීම සාර්ථක සංධීය ක්‍රමය බිහිවීම සඳහා අවශ්‍යමය.

- <u>අසල්වැසි ප්‍රදේශ ඒකාබද්ධවීම.</u>

අසල්වැසි ප්‍රදේශ ඒකාබද්ධවීමෙන් සැදුනු සංධීය ක්‍රමයක් වීම ද සංධීය ක්‍රමය සාර්ථකවීම කෙරෙහි බලපායි. එකිනෙකට දුරස්ව පිහිටි භූමි ප්‍රදේශ එක්වී නිර්මාණය වන සංධීය ක්‍රම සාර්ථක සංධීය ක්‍රමයක් නොවේ.

- <u>පොදු ජාතිකත්වයක් තිබීම.</u>

සාර්ථක සංධීය ක්‍රමයක පැවැත්ම සඳහා පොදු ජාතිකත්වයක් තිබීම වැදගත් වේ. පොදු ජාතිකත්වයකින් තොරව වාර්ගිකත්වය මත ක්‍රියාත්මක වන රාජ්‍යයන් එකිනෙකට එකතු වී සංධීය ක්‍රමය ගොඩනගාගැනීම තුළ වාර්ගිකව ඇතිවන ගැටීම නිසා සංධීය ක්‍රමය කැඩීගොස් ඒ ඒ වාර්ගික කොටස් මගින් ස්වාධීන රාජ්‍යයන් නිර්මාණය කරගැනීමට පෙළඹේ. එම නිසා සංධීය ක්‍රමයට එළඹෙන විට පොදු ජාතිකත්වයක් ඇති වීම එම සංධීය ක්‍රමය සාර්ථක වීමට බලපායි.

● **ආර්ථිකය**

සංධීය ක්‍රමයට එළඹෙන රාජ්‍යයන් අතර  සමාන ආර්ථික හැකියාවක් තිබීම එම සංධීය ක්‍රමය සාර්ථක වීමට බලපායි. එසේම සංධීය ක්‍රමයකයකට එළඹී ඇති රාජ්‍යයන් කිහිපයක් ස්වකීය සංධීය ක්‍රමය තුළ ආර්ථිකයේ සංවර්ධනයක් නොමැතිනම් එම ක්‍රමය තවදුරටත් නඩත්තු කිරීම අතහැර දැමිය හැකිය. එම නිසා ආර්ථික සාධකය සාර්ථක සංධීය ක්‍රමයක් උදෙසා බලපායි.

● **ශක්තිමය නීතිමය අධිකාරියක් තිබීම.**

සාර්ථක සංධීය ක්‍රමයක පැවැත්ම සඳහා ශක්තිමත් නීතිමය අධිකාරියක පැවැත්ම ඉතා වැදගත් වේ. සංධීය ක්‍රමයක් තුළ මධ්‍ය හා ප්‍රාන්ත ආණ්ඩු වශයෙන් ආණ්ඩු වර්ග දෙකක් පවතින නිසා බලතල මත ප්‍රාන්ත හා මධ්‍යය ආණ්ඩු අතර ඇතිවන ගැටුම් විසඳීමට ශක්තිමත් නීතිමය අධිකාරියක් තිබිය යුතුය.

නමුත් නීතිමය අධිකාරිය පමණක් සාර්ථක සංධීය ක්‍රමයක් සඳහා කිසි විටෙකත් ප්‍රමාණවත් නොවේ. නිදර්ශන ලෙස මධ්‍යය **අප්‍රිකානු සංධීය ක්‍රමය ගොඩනගනු ලබන්නේ උත්තරාරෝපිතව ඇති කළ නීතිමය අධිකාරියක් මගිනි.** නමුත් එම මධ්‍යය අප්‍රිකානු සංධීය ක්‍රමය කැඩීගොස් **උතුරු රොඩේෂියාව - දකුණු රොඩේෂියාව - මලාවි** ලෙස ස්වාධීන රාජ්‍යයන් බිහිවීම.

● **කොටස් රාජ්‍යයන්ට සමානව සැලකීම.**

සංධීය ක්‍රමයක සාර්ථකත්වය සඳහා බලපානු ලබන තවත් සාධකයක් වන්නේ කොටස් රාජ්‍යයන්ට සමානව සැලකීමයි. මින් අර්ථවත් වන්නේ **භූමි ප්‍රමාණය - ජනගහනය - ආර්ථික ශක්තිය - වාර්ගික පදනම - ආගමික පදනම - සංස්කෘතික පදනම නොසලකා හරිමින් කොටස් රාජ්‍යයන්ට සමාන වරප්‍රසාද ලබාදීමයි.** කොටස් රාජ්‍යයන්ට සමානව සැලකීම සාර්ථක සංධීය ක්‍රමයක පැවත්මට අත්‍යවශ්‍යය වේ.

● **බලතල හා කාර්යය ක්ෂෙත්‍රය ඉතා පැහැදිලිව බෙදා දැක්වීම.**

● **නිදහස් ශක්තිමත් අධිකරණයක් පැවැතීම.**

● **ලිඛිත ව්‍යවස්ථාව සහ එහි උත්තරීතර භාවය.**

# සංඝීය ක්‍රමයේ නව ප්‍රවණතා

## සංඝීය ක්‍රමයේ නව ප්‍රවනතා

සංඝීය ක්‍රමයේ නව ප්‍රවනතාවය යන්නෙන් අර්ථවත් වන්නේ මධ්‍යම ආණ්ඩුව බලවත්වීමයි. **මධ්‍යම ආණ්ඩුව බලවත්වීම සඳහා බලපෑ හේතු කිහිපයකි.**

- ප්‍රාන්ත ආණ්ඩු තමන් සතු බලතල කැමැත්තෙන්ම මධ්‍ය ආණ්ඩුවට පවරාදීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම මගින්.
- අධිකරණ විවරණය මගින්
- රාජ්‍යය සුභසාධන සංකල්පය වර්ධනයවීම නිසා.
- නූතන තාක්ෂණයේ දියුණුව සමග ප්‍රාදේශීයව ඇතිවන දුරස්ථභාවය අවමවීම නිසා.
- ප්‍රධාන විෂයයන් වල බලතල මධ්‍යය ආණ්ඩුව සතු කිරීම නිසා
- ජාතික හා ජාත්‍යන්තරව දේශපාලනය තුල ඇතිවන ආර්ථික , සාමාජීය හා දේශපාලන ප්‍රශ්න

(**N.B.** මීට අදාළ තත්ත්වයන් සටහන් කරන්න.)

# ව්‍යවස්ථානුකූල වාදය

# ව්‍යවස්ථානුකූල වාදය

● <u>ව්‍යවස්ථානුකූල වාදය හැඳින්වීම</u>

<u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මත පදනම් වී පාලන කටයුතු සිදු කිරීම ව්‍යවස්ථානුකූල වාදය ලෙස නිර්වචනය කළ හැකිය.</u> මෙය වෙනත් ආකාරයකින් දක්වන්නේ නම්,

**"ආණ්ඩුකරණය සිදුකළ යුත්තේ නීති වලින් හා රෙගුලාසි වලින් ඇති කරන ලද සීමාවන්ට යටත්වය යන්න මින් අර්ථවත් වේ."**

**"ව්‍යවස්ථානුකූලවාදය හඳුනාගත යුත්තේ බෙදී ගිය බලය සහිත ආණ්ඩුක්‍රමයක් වශයෙනි. මෙහි දී සිදුවන්නේ ආණ්ඩුවේ බලය නීතියේ සංවරණයට පාත්‍ර කිරීම වේ"**

ව්‍යවස්ථානුකූල ප්‍රතිරෝධතාවයේ ස්වභාවය

**<u>ආණ්ඩුවේ අධිකාරියට ව්‍යවස්ථානුකූල විධි නියමයන් හරහා ඇතිකර ඇති අවහිරය දේශපාලන ක්‍රමයෙන් දේශපාලන ක්‍රමයට ගතික වේ.</u>** ඇතැම් දේශපාලන ක්‍රමයක ආණ්ඩුවේ බලය මත වැඩි ව්‍යවස්ථානුකූල වැඩි ප්‍රතිරෝධයක් යෙදවිය හැකි අතර, ඇතැම් දේශපාලන ක්‍රමයක අඩු ප්‍රතිරෝධයක් යොදා තිබිය හැකිය. එම නිසා ව්‍යවස්ථානුකූල වාදය ධ්‍රැව දෙකක් අතර කුමන හෝ ලක්ෂ්‍යයක ස්ථාන ගත වී තිබිය හැකිය. එම ධ්‍රැව දෙක වන්නේ අඩු ප්‍රතිරෝධීතාවය සහ වැඩි ප්‍රතිරෝධීතාවයයි. **<u>ආණ්ඩුවේ බලය මත ව්‍යවස්ථානුකූල ප්‍රතිරෝධීතාවය වැඩි නම් සිවිල් සමාජයේ නිදහස හා පුරවැසි අයිතිවාසිකම් වලට යහපත් වෙයි. ආණ්ඩුවේ බලය මත ව්‍යවස්ථානුකූල ප්‍රතිරෝධීතාවය අඩු නම් සිවිල් සමාජයේ නිදහසට හා පුරවැසි අයිතිවාසිකම් වලට බාධාකාරී විය හැකිය.</u>**

<u>යම් රාජ්‍යක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තිබුණ පමණින් එම රාජ්‍යය තුළ ව්‍යවස්ථානුකූලවාදය ක්‍රියාත්මක වන්නේ යැයි ප්‍රකාශ කළ නොහැකිය.</u> එයට හේතු වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නොසලකා හරිමින් පාලන කටයුතු කිරීමට ඇතැම් අත්තනෝමතික පාලකයන්ට හැකිවීමයි,

**ජර්මානු රාජ්‍යය තුළ හිට්ලර්ගේ පාලන අවධිය. . . .**
**ඉතාලියානු රාජ්‍යය තුළ මුසෝලිනීගේ පාලන අවධිය . . . .**
**උගන්ඩානු රාජ්‍යය තුළ ඉඩිඅමින්ගේ පාලන අවධිය. . . .**
**කාම්බෝජයේ පොල්පොට්ගේ පාලන අවධිය. . . .**
**පිළිපීනයේ මාකෝන්ගේ පාලන අවධිය. . . .**

ඊට අදාළ අයෝමය නිදර්ශන වශයෙන් ඉදිරිපත් කළ හැකිය.

<u>වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ව්‍යවස්ථානුකූලාවදය ලෙස නිර්වචනය කළ හැක්කේ</u> **"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මූලික නීතිය - ශ්‍රේෂ්ඨ නීතිය - උත්තරීතර නීතිය ලෙස සලකා එයට ගරුකරමින්, එය පූජනීයත්වයෙහි ලා , ශුද්ධත්වයෙහි ලා සලකමින් පාලන කටයුතු සිදු කිරීමයි."**

- **<u>ව්‍යවස්ථානුකූලවාදය පැවතීමට අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුතු සංකල්ප දෙකකි.</u>**

**(i)** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම.
**(ii)** නීතියේ ආධිපත්‍යයක් ක්‍රියාත්මක වීම.

- **<u>ව්‍යවස්ථානුකූලවාදයට අදාළ ඓතිහාසික විකාශනය</u>**

ග්‍රීක අවධිය

ව්‍යවස්ථානුකූලවාදය සම්බන්ධ සංවාද තුළදී ව්‍යවස්ථානුකූලවාදයට අදාළ ඓතිහාසික විකාශනය හඳුනාගැනීම වැදගත් වේ. ව්‍යවස්ථානුකූලවාදය දීර්ඝ ඓතිහාසික පදනමක් සහිත දේශපාලන සංකල්පයකි. **<u>ඉපැරණි ග්‍රීක</u>** නාගරික රාජ්‍යය ක්‍රමය තුළ මෙම සංකල්පය පිළිගැනීමට ලක්වී තිබේ.

රෝම - මධ්‍යතන අවධිය

රෝම හා මධ්‍යතන යුගයන්තුළ දී ප්‍රජාතන්ත්‍රවාදී ඇගයුම් අභාවයට ගොස් පරම බලැති රාජාණ්ඩුක්‍රම හිස එසවීමත් සමඟ ව්‍යවස්ථානුකූලවාදය දියවී යයි.

නූතන අවධිය

නූතන අවධිය එනම්, 17 වැනි සියවස් තුළ <u>ලිබරල්වාදී දේශපාලන න්‍යායේ</u> උත්පාදයත් සමඟ මෙම සංකල්පය බිහිවෙයි. විශේෂයෙන් ලිබරල්වාදයේ <u>"සීමිත බලැති ආණ්ඩු"</u> ව්‍යවස්ථානුකූලවාදයේ කේන්ද්‍රී ලක්ෂ්‍යය ලෙස පෙන්වාදිය හැකිය.

ජෝන් ලොක් සහ ඔහුගේ විග්‍රහය

<u>ව්‍යවස්ථානුකූලවාදයේ පියා වන්නේ එංගලන්ත ජාතික ජෝන් ලොක්ය.</u> ලොක් ලිබරල්වාදයේ ප්‍රබල කථිකයකු වේ. ලොක් 1689 ප්‍රකාශයට පත්කල **සිවිල් ආණ්ඩුව පිළිබඳ ප්‍රවාදයන් දෙකක්** යන දේශපාලන ලියවිල්ල හරහා ප්‍රකාශය තුළ ව්‍යවස්ථානුකූලවාදයට අදාළ පදනම නිර්මාණය කරයි.

ජොන් ලොක් ප්‍රකාශ කළේ <u>"පාලකයාත් ජනතාවත් නීතියට අනුකූල වේ."</u> යනුවෙනි. ලොක් විසින් <u>"සීමිත බලැති ව්‍යවස්ථානුකූල රාජාණ්ඩුවක් නිර්මාණය කළේය."</u> මෙම ව්‍යවස්ථානුකූල පාලකයකු නිර්මාණ කිරීමට අදාළ හේතුව 1688 දී ඉංග්‍රීසි විප්ලවයේ දී (රජු හා පාර්ලිමේන්තුව අතර ගැටුමේ දී) පාර්ලිමේන්තු පාර්ශවය ලොක් විසින් නියෝජනය කිරීමයි. ජෝන් ලොක් ස්වකීය **"සමාජ සම්මුතිවාදී විග්‍රහය හරහා ඉතිහාසයේ ප්‍රථම වරට අසහාය බලැති රාජාණ්ඩුක්‍රමය ව්‍යවස්ථානුකූල රාජාණ්ඩුක්‍රමයක් බවට පත්වීමට අදාළ මතවාදය නිර්මාණය කළේය."** මෙ පරිදිව නූතන අවධියේ 17 වැනි සියවස තුළ අලිඛිත ස්වරූපයකින් ව්‍යවස්ථානුකූලවාද බ්‍රිතාන්‍ය තුළ උත්පාදවෙයි.

**ජෝන් ලොක් විග්‍රහකරනු ලබන්නේ,**

**ව්‍යවස්ථාධායකය නීති සම්පාදනය කළ යුතුය, විධායකය නීති ක්‍රියාත්මක කළ යුතුය, අධිකරණය නීති විනිශ්චය කළ යුතුය. විශේෂයෙන් විධායකය ව්‍යවස්ථාදායකයේ සහ අධිකරණයේ අධීක්ෂණයටත්, පාලනයටත් යටත්ව පැවතිය යුතු ය. තවදුරටත් මහජනතාව ව්‍යවස්ථාදායකයට බලය පවරා ඇති නිසා ව්‍යවස්ථාධායකය උත්තරීතර වේ. ව්‍යවස්ථාදායකය නීති සම්පාදනය කරන විට සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයකි.**

1. ව්‍යවස්ථාදායකය පනවන නීති මුළු මහත් සමාජයටම වලංගු විය යුතු අතර මිනිසුන් විශේෂීකරණ කරමින් නීති පැනවීම නොකළ යුතු ය.

2. අත්තනෝමතික නීති පැනවීමට ව්‍යවස්ථාදායකයට නොහැක.

3. ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදන බලය අත්හරින ඇතැම් නීති පැනවීම නොකළ යුතු ය.

4. මහජන අනුමැතියකින් තොරව බදු අයකරන නීති නොපැනවිය යුතු ය.

වර්තමාන තත්ත්වය

ව්‍යවස්ථානුකූලවාදය සම්බන්ධ නූතන කතිකාව බවට පත්වන්නේ "**ව්‍යවස්ථානුකූල භක්ති යයි.**" මින් අර්ථවත් වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පාලිතයාගේ මෙන්ම පාලකයාගේ ගෞරවයට, පූජනියත්වයට බඳුන් වන ශුද්ධ වූ දේශපාලන සංකල්පයක් බවයි. වර්තමානය තුළ ව්‍යවස්ථානුකූල භක්තිය නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජනතාව විශ්වාස කරන සිවිල් ආගමක් බවට පත්ව තිබේ. **ව්‍යවස්ථානුකූල භක්තිය උත්පාදවීමට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සිවිල් ආගමක් ලෙස පුරවැසියන්ගේ සන්තාන තුළ ගෞරවයට පාත්‍රවීමට හේතු**

**(i)** **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අඛණ්ඩව දිගුකාලයක් පැවතීම.**
**(ii)** **ව්‍යවස්ථාව ස්වකීය, ආරක්ෂකයාය, මගපෙන්වන්නාය, යන විශ්වාසය**
**(iii)** **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සැමට ඉහළින් ඇති දෙයක් වීම.**

## ● ව්‍යවස්ථානුකූලවාදයට අදාළ ඓතිහාසික වශයෙන් වැදගත් සංධිස්ථාන

(i) 1688 ඉංග්‍රීසි විල්පවය (උත්කෘෂ්ට විල්පවය)

1688 උත්කෘෂ්ට විප්ලවය අඩසියවකට ආසන්න කාලයක් පැවතුනි. රජු හා පාර්ලිමේන්තුව අතර ඇති වූ මතවාදී ගැටීම තුළින් අසහාය බලැති රාජාණ්ඩුක්‍රමය ව්‍යවස්ථානුකූල රාජාණ්ඩුක්‍රමයක් බවට විකාශනය විය. එය නූතනය තුළ ව්‍යවස්ථානුකූල පාලන ක්‍රමයන්හි උත්පාදයට අදාළ ප්‍රථම සංදිස්ථානයයි.

(ii) 1689 අයිතිවාසිකම් පනත (බ්‍රිතාන්‍යය)

1689 අයිතිවාසිකම් පනත මගින් ව්‍යවස්ථාධායකය උත්තරීතර නීති සම්පාදකයා බවට තව දුරටත් පිළිගැනුනි. එය විධිමත්ව කැඳවිය යුතු බවත්, පුද්ගල යිතිවාසිකම් සම්බන්ධයෙන් ද මෙම පනත මගින් අවධානය යොමු කළේ ය.

(iii) 1776 ඇමරිකානු විප්ලවය සහ 1789 ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

බ්‍රිතාන්‍යය තුළ නිර්ලිඛිත මට්ටමින් නිර්මාණය වන ව්‍යවස්ථානුකූල වාදය 1789 ඇමරිකානු ආණ්ඩුක්‍රමයන් සමඟ ලිඛිත මට්ටමින් නිර්මාණය වෙයි. එය ව්‍යවස්ථානුකූලවාදය සම්බන්ධ තවත් වැදගත් සංධිස්ථානයකි.

(iv) 1789 ප්‍රංශ විප්ලවය සහ 1809 ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව